2022 ජූනි 02
2022 ஜுன் 02
02 June 2022

NAOSL

වාර්තාවේ අංකය : ඩබ්එන්පී2/සීබී/එච්/එල්ජීඊඑස්පී/පීඒ/2019
அறிக்கை இல. : டபிள்யூஎன்பீ2/சீபீ/எச்/எல்ஜீஈஎஸ்பி/பிஏ/2019
Report No : WNP2/CB/H/LGESP/PA/2019

# පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම

## உள்ளூராட்சி நிறுவனங்களை மேம்படுத்தும் துறைசார்ந்த் செயற்திட்டங்களிலிருந்து (புரநெகும) எதிர்பார்த்த பிரதிபலன்களை பெற்றுக்கொள்ளும் செயன்முன்னேற்றத்தினை மதிப்பாய்வு செய்தல்

# Assess the expected benefits been reaped by the Local Government Enhancement (Pura Neguma) Sector Project



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE









# පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියෙන් (පුරනැගුම) අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමේ ප්‍රගතිය ඇගයීම

ඩබ්ලිව්එන්පී$_2$/සීබී/එච්/එල්ජීඊඑස්පී/පීඒ/2019

ජාතික විගණන කාර්යාලය

# පටුන


| | | | | විස්තරය | පිටු අංක |
|---|---|---|---|---|---|
| **1.** | | | | **විධායක සාරාංශය** | **5-6** |
| **2.** | | | | **හැඳින්වීම** | **7-12** |
| | 2.1 | | | පසුබිම | 7-11 |
| | | 2.1.1 | | ව්‍යාපෘතියේ අරමුණු | 7-10 |
| | | | 2.1.1.1 | බස් නැවතුම්පොළවලින් අපේක්ෂිත අරමුණු | 8 |
| | | | 2.1.1.2 | ජලසම්පාදන ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු | 8 |
| | | | 2.1.1.3 | බහුකාර්ය ගොඩනැගිලිවලින් අපේක්ෂිත අරමුණු | 8-9 |
| | | | 2.1.1.4 | පුස්තකාලවලින් අපේක්ෂිත අරමුණු | 9 |
| | | | 2.1.1.5 | සතිපොළවලින් අපේක්ෂිත අරමුණු | 9-10 |
| | | | 2.1.1.6 | සනීපාරක්ෂක මධ්‍යස්ථානවලින් අපේක්ෂිත අරමුණු | 10 |
| | | | 2.1.1.7 | ආදාහනාගාරවලින් අපේක්ෂිත අරමුණු | 10 |
| | | 2.1.2 | | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්යභාරය | 10 |
| | | 2.1.3 | | ප්‍රාදේශීය සභා | 11 |
| | 2.2 | | | විගණනය සඳහා අධිකාරී බලය | 11 |
| | 2.3 | | | මාතෘකාව තෝරා ගැනීමේ පදනම | 11 |
| | 2.4 | | | විගණන විෂය පථය | 11-12 |
| | 2.5 | | | මෙම විගණනයේ අරමුණු | 12 |
| **3** | | | | **විගණන නිරීක්ෂණ** | **12-43** |
| | 3.1 | | | සැලසුම් කිරීම | 12-13 |
| | | 3.1.1 | | මූලික අධ්‍යයනයන් | 12 |
| | | 3.1.2 | | සංයුක්ත සැලැස්ම | 13 |
| | | 3.1.3 | | ක්‍රියාකාරී සැලැස්ම | 13 |
| | | 3.1.4 | | මූල්‍ය සැලැස්ම | 13 |
| | 3.2 | | | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 13 |
| | | 3.2.1 | | ව්‍යාපෘතිය හා උප ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයන් | 13-17 |
| | | 3.2.2 | | උපව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් | 14-15 |
| | | 3.2.3 | | උප ව්‍යාපෘති සැලසුම් හා ඉදිකිරීම්වල යෝග්‍යතාව | 15-17 |
| | | | | (අ). මාවතගම බස් නැවතුම්පොළ | 15-16 |
| | | | | (ආ). රෙමුණ ජල යෝජනා ක්‍රමය | 16 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | (ඇ). උඩපළාත ජල යෝජනා ක්‍රමය | | 16-17 |
| | | | (ඈ). වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ විදුලි සෝපානය සවි කිරීම | | 17 |
| | 3.3 | ව්‍යාපෘතියේ කාර්යසාධනය | | | 17-42 |
| | | 3.3.1 | මූල්‍ය කාර්යසාධනය | | 17-18 |
| | | 3.3.2 | භෞතික කාර්යසාධනය | | 18-42 |
| | | | 3.3.2.1 නිශ්කාර්ය උපව්‍යාපෘති | | 18-27 |
| | | | (අ) | වනාතවිල්ලුව ජල යෝජනා ක්‍රමය | 19-20 |
| | | | (ආ) | විල්ගමුව ජල යෝජනා ක්‍රමය | 20 |
| | | | (ඇ) | මදුරාවල ප්‍රාදේශීය සභාවේ රෙමුණ හා දික්ලන්ද ජල යෝජනා ක්‍රම | 20-21 |
| | | | (ඈ) | මහව පොල්පිතිගම ජල යෝජනා ක්‍රමය | 21-22 |
| | | | (ඉ) | රිදීගම බස් නැවතුම්පොළ | 22-23 |
| | | | (ඊ) | මීගහකිවුල බස් නැවතුම්පොළ | 23-24 |
| | | | (උ) | කිරම බස් නැවතුම්පොළ | 24-25 |
| | | | (ඌ) | ලංකාපුර බස් නැවතුම්පොළ | 25-26 |
| | | | (එ) | ඉඹුල්පේ බහුකාර්ය ගොඩනැගිල්ල | 26 |
| | | | (ඒ) | හල්දුම්මුල්ල බහුකාර්ය ගොඩනැගිල්ල | 26-27 |
| | | | (ඔ) | ඉපලෝගම,පලාගල,තිරප්පනේ සනීපාරක්ෂක මධ්‍යස්ථාන | 27 |
| | | | 3.3.2.2 ඌණ උපයෝජිත උප ව්‍යාපෘති | | 27-33 |
| | | | (අ) | රඹෑව බහුකාර්ය ගොඩනැගිල්ල | 27-28 |
| | | | (ආ) | තිරප්පනේ බහුකාර්ය ගොඩනැගිල්ල | 28 |
| | | | (ඇ) | නාවුල ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල | 29 |
| | | | (ඈ) | මිණිපේ ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල | 29 |
| | | | (ඉ) | අඹන්ගඟ කෝරළේ, ගඟවට කෝරළේ සහ තුම්පනේ ප්‍රාදේශීය සභාවල බහුකාර්ය ගොඩනැගිලි | 29-30 |
| | | | (ඊ) | බියගම සහ මදුරාවල බහුකාර්ය ගොඩනැගිලි | 30 |
| | | | (උ) | වළල්ලාවිට බහුකාර්ය ගොඩනැගිල්ල | 30 |
| | | | (ඌ) | වලපනේ ප්‍රාදේශීය සභාවේ රාගල බහුකාර්ය ගොඩනැගිල්ල | 30-31 |
| | | | (එ) | නාගොඩ බහුකාර්ය ගොඩනැගිල්ල | 31 |
| | | | (ඒ) | කල්පිටිය පුස්තකාල ගොඩනැගිල්ල | 31-32 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | (ඔ) | තිස්සමහාරාම සතිපොළ | 32 |
| | | | (ඕ) | සූරියවැව සතිපොළ | 32-33 |
| | | | (ක) | රත්තොට සතිපොළ ගොඩනැගිල්ල | 33 |
| | | 3.3.2.3 අපේක්ෂිත ප්‍රතිලාභ නොමැති උප ව්‍යාපෘති | | | 33-41 |
| | | | (අ) | මාවතගම බස් නැවතුම්පොළ | 33-34 |
| | | | (ආ) | උඩුදුම්බර ජල යෝජනා ක්‍රමය | 34-35 |
| | | | (ඇ) | රත්තොට ජල යෝජනා ක්‍රමය | 35 |
| | | | (ඈ) | ලග්ගල පල්ලේගම ජල ව්‍යාපෘතිය | 36 |
| | | | (ඉ) | රාජාංගනය ජල ව්‍යාපෘතිය | 36 |
| | | | (ඊ) | පොල්පිතිගම බහුකාර්ය ගොඩනැගිල්ල | 36-37 |
| | | | (උ) | ගලෙන්බිදුණුවැව බහුකාර්ය ගොඩනැගිල්ල | 37 |
| | | | (ඌ) | පදවිය බහුකාර්ය ගොඩනැගිල්ල | 38 |
| | | | (එ) | හොරොව්පතාන බහුකාර්ය ගොඩනැගිල්ල | 38 |
| | | | (ඒ) | ඉපලෝගම බහුකාර්ය ගොඩනැගිල්ල | 38-39 |
| | | | (ඔ) | වැලිවිටිය දිවිතුර බහුකාර්ය ගොඩනැගිල්ල | 39 |
| | | | (ඕ) | කරන්දෙණිය,තවලම, පිටබැද්දර, කොටපොළ, ඉමදූව ප්‍රාදේශීය සභා සඳහා ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි | 39-40 |
| | | | (ක) | බුලත්කොහුපිටිය බහුකාර්ය ගොඩනැගිල්ල | 40 |
| | | | (ඛ) | අයගම බහුකාර්ය ගොඩනැගිල්ල | 40 |
| | | | (ග) | හෙට්ටිපොළ ආදාහනාගාරය | 41 |
| | | 3.3.2.4 අපේක්ෂිත අරමුණෙන් බැහැරව කාර්යාල පවත්වා ගැනීමට යොදවා ඇති බහුකාර්ය ගොඩනැගිලි | | | 41-42 |
| | | | (අ) | උඩුබද්දාව බහුකාර්ය ගොඩනැගිල්ල | 41-42 |
| | | | (ආ) | පාතහේවාහැට බහුකාර්ය ගොඩනැගිල්ල | 42 |
| | 3.4 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | | 43 |
| **4** | **නිර්දේශ** | | | | **43-44** |
| | ඇමුණුම 01 (Overall Project Implementation Plan) | | | | 45 |
| | ඇමුණුම 02 (2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිම නොවූ උප ව්‍යාපෘති) | | | | 46-47 |
| | ඇමුණුම 03 (Detailed Cost Estimates by Year) | | | | 48 |

## 1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ පළාත් පාලනය සම්බන්ධයෙන් ඉතා දීර්ඝ ඉතිහාසයක් පවතින අතර එය ක්‍රි.පූ. 03 වන සියවසේ පිහිටුවන ලද ලේඛනවලින් ලැබෙන තොරතුරු අර්ථකථනය කිරීමෙන් සනාථ වන බව විද්වතුන්ගේ මතය වේ. මේ වන විට පළාත් පාලන ආයතන වර්ග තුනකි. එනම් මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යනුවෙනි. මෙයින් කුඩා ම පළාත් පාලන ආයතනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් හඳුන්වා දුන් "ප්‍රාදේශීය සභාව" වේ. 1987 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දුන් 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් පාලනය පළාත් සභා විෂයයක්ව පවතී.

විශේෂයෙන් රටේ ප්‍රධාන නගරවලින් දුරබැහැරව පවතින ප්‍රාදේශීය සභාවලින් ජනතාවට ලබා දිය යුතු සේවාවන් ලබා දීම, අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීම එම ප්‍රාදේශීය සභාවන්ට ස්වශක්තියෙන් සිදු කර ගැනීම දුෂ්කර වීම හේතුවෙන් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන විදේශීය ණය ව්‍යාපෘති මගින් මෙම පළාත් පාලන ආයතන නගා සිටුවීමට විවිධ ආයෝජනයන් සිදු කරමින් පවතී.

ප්‍රාදේශීය සභා මට්ටමෙන් සලකා බලන විට ප්‍රාදේශීය පාලන නායකත්වයේ මඟ පෙන්වීම හා නිලධාරීන්ගේ අවංක කැපවීම මත ආර්ථික දුෂ්කරතා මඟහරවා ගනිමින් ජනතාවට උපරිම සේවයක් ලබාදීම සඳහා කටයුතු කරනු ලබන ප්‍රාදේශීය සභාවන් ද නැත්තේ නොවේ. ඒ ඉතාම අතලොස්සක් පමණි. ජනතාවට අවශ්‍ය ව්‍යාපෘති හඳුනා නොගැනීම, අවශ්‍යතා අනුපිළිවෙළකට පෙළ ගස්වා නොගැනීම ආදී කරුණු හේතුවෙන් සමහර පළාත් පාලන ආයතන ප්‍රමාණවත් වර්ධනයක් පෙන්නුම් නොකරයි.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියට පවරා ඇති විෂය පථය තුළ වූ කාර්යභාරය දෙයාකාර වේ.

- අනිවාර්යයෙන් ඉටුකිරීමට බැඳී ඇති කාර්යයන්
- ඉටුකිරීමට බලය ඇතත් අනිවාර්ය නොවූ කාර්යයන්

සෑම පළාත් පාලන ආයතනයක් වෙත ම ඉටුකිරීමට බලය පවරා ඇතිවාක් මෙන් ම අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු කාර්යයන් ලෙස බල ප්‍රදේශය තුළ ඇති මංමාවත් සහ මහජන සෞඛ්‍යයට අදාළ වන කර්තව්‍යයන් (Duties) නීතියෙන් නියම කොට ඇත. එම කටයුතු ඉටු නොකිරීම හෝ හිතාමතා පැහැර හැරීම යුතුකම හා වගකීම පැහැර හැරීමක් ද වන්නේ ය.

ඉටුකිරීමට බලය පැවරී ඇති මුත් අනිවාර්යයෙන් ම ඉටුකිරීමට නීතියෙන් නියම වී නැති කාර්යයන් ද තිබේ. පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති පොදු උපයෝගිතා සේවා, සුබසාධන සේවා, අධ්‍යාපන, ආගමික හා සංස්කෘතික සේවා මීට අයත් වේ. මෙම සේවාවන් සැලසීමට බලය

ලැබී ඇතත් ඒවා ඉටු කළ හැක්කේ ආයතනයේ සම්පත් ප්‍රමාණය හා ජනතාව ඒ කෙරෙහි ඇති ඉල්ලුම හෙවත් අවශ්‍යතාව සැලකිල්ලට ගැනීමෙනි. ආයතනයේ ප්‍රමුඛතාව ලැබිය යුත්තේ ආයතනයේ යුතුකම් හා වගකීම් ඉටුකිරීම පිණිස ය.

ඒ අනුව මාතෘ සායනයේ පටන් ආදාහනාගාරය දක්වා වූ මිනිස් ජීවිතයට අවශ්‍ය සියලුම පහසුකම් සැපයීමේ වගකීම පළාත් පාලන ආයතන වෙත ම පැවරී තිබේ. ඒ අනුව මාතෘ සායන, සෞඛ්‍ය සායන, බෙහෙත් ශාලා, ආයුර්වේද වෛද්‍ය සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, කැළි කසළ කළමනාකරණය, බෝවන රෝග හා වසංගත රෝග පාලනය කර ගැනීම, නගර නිර්මාණය, නාගරික සැලසුම් අනුමත කිරීම, වීථි ආලෝකකරණය, කර්මාන්තශාලාවලින් සිදුවන පරිසර හානි වළක්වා ගැනීමට කටයුතු කිරීම, දරුවන් හා වැඩිහිටියන් සඳහා පුස්තකාල සේවා පවත්වාගෙන යාම, ළදරු පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පමණක් නොව ආදාහනාගාර හා සුසාන භූමි පවත්වාගෙන යාම, නගරය සෞඛ්‍යාරක්ෂිතව හා අලංකාරව පවත්වාගෙන යාමේ වගකීමත් මෙම කුඩා ආයතනයට පැවරී ඇත.

පළාත් පාලන ආයතන සතු බලතල මෙන් ම නාගරික පදිංචිකරුවන්ගේ ඉල්ලීම් හේතුවෙන් ද යහපාලන මූලධර්මයන්ගෙන් බැහැරව ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මහජන ඉල්ලීම් ඉටුකිරීමට අසමත් ආයතන ලෙස බොහෝ දෙනෙකු විසින් හඳුනාගෙන ඇත.

කෙසේ වුව ද මහජනතාවට ප්‍රමාණවත් සේවයක් සපයන, ආදායම අතින් ශක්තිමත් පදනමක් සහිත පළාත් පාලන ආයතන පද්ධතියක් ගොඩ නගා ගැනීම මගින් රට වැසියාගේ දිවි පැවැත්ම වඩාත් පහසු කරවනු නොඅනුමාන ය. ඒ සඳහා මධ්‍යම රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අත්‍යවශ්‍ය හා සාර්ථක ව්‍යාපෘති බවට පත් වීමත්, එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට හා පළාත් පාලන ආයතනවලට ලැබීමත් අත්‍යවශ්‍ය කරුණු බවට අවධාරණය කෙරේ.

එසේ වුවත් පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති කළමනාකරණ සංග්‍රහයේ සඳහන් නිර්නායකවලට අනුකූලව උප ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා අධ්‍යයනයන් සිදු නොකර උප ව්‍යාපෘති තෝරා ගැනීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය, ක්‍රියාකාරී සැලසුම් සහ ව්‍යාපෘති මූල්‍ය සැලසුම් කළමනාකරණ සංග්‍රහය අනුව සකස් නොකිරීම, ප්‍රසම්පාදන ප්‍රමාදයන්, ඉදිකිරීම්වල අයෝග්‍යතාවයන්, ඉදිකිරීම් නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතීම මෙන්ම අපේක්ෂිත අරමුණු ඉටුනොවන අවස්ථාවන් බහුල ව පවතින බව මෙන්ම නියමිත කාල වකවානුව තුළ ඉදිකිරීම් අවසන් කර ව්‍යාපෘතිය අවසන් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යාල පවත්වා ගෙන යාමට සහ උපදේශක සමාගම්වලට අතිරේක ගෙවීම් කිරීමට සිදුවීම ඇතුළු කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.

## 2. හැඳින්වීම

### 2.1 පසුබිම

ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා සහනදායී පොළී අනුපාත යටතේ ණය දෙන ආයතනයක් වන ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදල් යටතේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වී ඇත. ඒ අතුරින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790 SRC (SF) දරන ණය ගිවිසුම මගින් පළාත් සභා 7කට අයත් ප්‍රාදේශීය සභා 100ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 68.8ක් එනම් රුපියල් මිලියන 8,940ක් යෙදවීමටත්, එයින් රු.මිලියන 7,892කට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 59ක් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යයනය කිරීමටත් එකඟ වී තිබුණි. කෙසේ වුව ද විදේශ ගැනුම් හිමිකම්වලට එරෙහිව ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් ප්‍රතිප්‍රමාණය වීම හේතුවෙන් ණය නියෝජිතායතනය එකඟ වන ලද මුදල රුපියල් මිලියන 7,892කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 52.04ක් ලෙස පසුව තීරණය කර තිබුණි. ඊට අමතරව ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් වැඩි වූ රුපියලේ වටිනාකමත් සමඟ පළාත් පාලන ආයතන ගණන 108ක් දක්වා ඉහළ දමා තිබුණු අතර 2015 ජූනි 30 වන විට නිම කළ යුතුව පැවති ව්‍යාපෘතිය 2017 ජූනි 30 දක්වා වසර 2කින් දීර්ඝ කර තිබුණි.

සහන කාලය අවසන් වීමෙන් අනතුරුව පොලිය ද සමඟ ණය වාරික ආපසු ගෙවීම 2019 නොවැම්බර් 15 දින ආරම්භ වූ අතර ආපසු ගෙවීම විශේෂ ගැනුම් හිමිකම් (SDR) 768,708කින් යුතු අර්ධ වාර්ෂික වාරික 48කින් සමන්විත විය. අවසාන වාරිකය 2043 මැයි 15 දින ගෙවිය යුතු වන අතර 2019 නොවැම්බර් 15 දින ගෙවන ලද 768,708ක් වූ විශේෂ ගැනුම් හිමිකම් (SDR) ණය වාරිකය ආසන්න වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 1.05ක් එනම් රුපියල් මිලියන 186.25ක් වශයෙන් ගණනය කළ හැකිය.

ණය වාරික ගෙවන අවස්ථාව වන විට ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට අපොහොසත් වුවහොත් මෙම ණය මුදල රජයට බරක් වනු ඇත. ඒ අනුව ණය වාරික ආපසු ගෙවීම සඳහා ණය ගැනීමට සිදුවීම වළක්වා ගත නොහැකි වනු ඇත.

#### 2.1.1 ව්‍යාපෘතියේ අරමුණු

පළාත් පාලන ආයතන සතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ගිණුම් කටයුතුභාවය, මූල්‍යමය හා තාක්ෂණික වශයෙන් ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මගින් කාර්යක්ෂම සේවයක් සැපයීම ප්‍රධාන අරමුණක් වේ. ඒ අනුව පාරිසරික, ආර්ථිකමය, මහජන සෞඛ්‍ය හා

පළාත් පාලන පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉදිකරන ලද ගොඩනැගිලිවලින් අපේක්ෂිත අරමුණු පහත දැක්වේ.

#### 2.1.1.1 බස් නැවතුම්පොළවලින් අපේක්ෂිත අරමුණු

(අ) බස් නැවතුම්පොළට ඇතුළුවන බස් හා වෙනත් වාහනවලින් අය කරනු ලබන නැවතුම් ගාස්තු, කඩකාමර කුලී හා සනීපාරක්ෂක පහසුකම් භාවිත කරනු ලබන මහජනතාවගෙන් අය කරන ගාස්තු මගින් ප්‍රාදේශීය සභාවට ආදායමක් ලැබීම.

(ආ) මගී ජනතාවට ආරක්ෂිතව බස්රථවලට නැගීමට හා බැසීමට පහසුකම් සැලසීම.

(ඇ) බස්රථ බලාපොරොත්තුවෙන් සිටින මගීන් සඳහා පහසුකම් සැලසීම.

(ඈ) මගී ජනතාවට සහ ප්‍රදේශයේ ගැවසෙන ජනතාව සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.

(ඉ) විවිධ වූ සේවා පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රදේශයේ පදිංචිකරුවන්ට ගත කිරීමට සිදුවන කාලය අවම කිරීම.

#### 2.1.1.2 ජලසම්පාදන ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු

(අ) කාලීනව ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කර පිරිසිදු ජලය ලබා දීමෙන් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සහ වියදම් අඩු කිරීම.

(ආ) පවුල් ඒකකයකට ජලය සපයා ගැනීම සඳහා දැරීමට සිදු වන වියදම අඩු කිරීම තුළින් ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.

(ඇ) වසර පුරාම උග්‍ර පානීය ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම.

(ඈ) ජලය සඳහා අය කරනු ලබන ගාස්තුවෙන් ප්‍රාදේශීය සභාව සඳහා ආදායම් උත්පාදන මාර්ගයක් සකස් කර ගැනීම.

(ඉ) වකුගඩු රෝග ආශ්‍රිත ප්‍රදේශවල ජනතාවට පිරිසිදු ජලය සැපයීම මගින් එම රෝග නිවාරණය සඳහා පිළියමක් යෙදීම.

(ඊ) කෘෂි නිෂ්පාදනවල ප්‍රමාණය වර්ධනය කර ගැනීම.

#### 2.1.1.3 බහුකාර්ය ගොඩනැගිලිවලින් අපේක්ෂිත අරමුණු

(අ) සේවාවන් කිහිපයක් එකම ස්ථානයක් තුළින් ඉටු කර ගැනීමට පහසුකම් සැලසීමෙන් ප්‍රදේශවාසීන්ගේ වියදම සහ කාලය අවම කිරීම.

(ආ) වෛද්‍ය සායනය මගින් පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කිරීමෙන් රජය සහ ජනතාව වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරන වියදම අඩු කිරීම.

(ඇ) දරුවන් සඳහා ආරක්ෂිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම හා එමගින් දෙමාපියන් එක් දරුවෙකු වෙනුවෙන් දරන මාසික වියදම අඩු කිරීම.

(ඈ) ප්‍රදේශයේ ජනතාවට උත්සව පැවැත්වීමට ස්ථානයක් සාධාරණ මිලට ලබා දීම.

(ඉ) ශ්‍රවණාගාරය, කඩ කාමර ඇතුළු ස්ථාන කුලියට ලබා දීමෙන් ප්‍රාදේශීය සභාව ආදායමක් ලබා ගැනීම.

(ඊ) ප්‍රදේශයේ ජනතාවට සාධාරණ මිලකට පහසුකම් සහිත පෙර පාසලක සේවය ලබා දීම.

### 2.1.1.4 පුස්තකාලවලින් අපේක්ෂිත අරමුණු

(අ) ප්‍රදේශයේ ජනතාවගේ සාක්ෂරතාවය හා කියවීමේ රුචිය වැඩිදියුණු කිරීම.

(ආ) ප්‍රදේශයේ ජනතාවට පුස්තකාලයකට ගමන් කිරීමට යන වාර්ෂික වියදම් අඩු කිරීම.

(ඇ) පුස්තකාල සාමාජිකයන්ගෙන් ලැබෙන සාමාජික ගාස්තු මගින් සභාවේ වාර්ෂික ආදායම වැඩි කර ගැනීම.

### 2.1.1.5 සතිපොළවලින් අපේක්ෂිත අරමුණු

(අ) පාරිභෝගික ජනතාවට වඩාත් පහසුවෙන් මිලදී ගැනීම සඳහා යටිතල පහසුකම් සැලසීම.

(ආ) සංචාරක වෙළෙඳුන්ට වෙළෙඳාම් කිරීම සඳහා දැනට පවත්නා තත්ත්වයට වඩා පහසුකම් සහිත ස්ථානයක් සකස් කිරීම.

(ඇ) සතිපොළට පැමිණෙන වෙළෙඳුන්ගෙන් ගාස්තුවක් අය කිරීමෙන් හෝ පොළ භූමිය බදුදීමෙන් ප්‍රාදේශීය සභාවේ ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීම.

(ඈ) වැඩි තරඟකාරීත්වය තුළින් පාරිභෝගික ජනතාවට හොඳ ම සහ නැවුම් එළවළු, පළතුරු හා මාළු ඇතුළු ද්‍රව්‍ය ලබා ගැනීමෙන් වියදම අඩු කර ගැනීමට ඉඩ සැලසීම.

(ඉ) වැඩි වෙළෙඳාම තුළින් වෙළෙඳ ප්‍රජාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

(ඊ) සතිපොළට පැමිණෙන වෙළෙඳුන්ට සහ පාරිභෝගික ජනතාවට ඉහළ මට්ටමෙන් සනීපාරක්ෂක පහසුකම් සැලසීම.

(උ) පිරිසිදු හා අලංකාර පොළ භූමියක් තුළින් ලෙඩ රෝග පැතිරීම අවම කර ගැනීමට දායක වීම.

(ඌ) සතිපොළ දිනවලදී අවිධිමත් ලෙස මාර්ගයේ වෙළෙඳාම් කිරීම හේතුවෙන් ඇති වන මාර්ග තදබදය අවම කිරීම සහ මාර්ග අනතුරු අවම කර ගැනීම.

(එ) ප්‍රදේශයේ ගොවි ජනතාවගේ නිෂ්පාදනවලට තරඟකාරී මිලක් ලබාදීම තුළින් ගොවීන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

(ඒ) අවිධිමත් පොළ භූමියක වෙළෙඳාම තුළින් සිදුවන එළවළු, පළතුරු නාස්තිය අවම කර ගැනීම.

### 2.1.1.6 සනීපාරක්ෂක මධ්‍යස්ථානවලින් අපේක්ෂිත අරමුණු

(අ) ගමනාගමන කටයුතුවල යෙදෙන මගී ජනතාවට සෞඛ්‍යාරක්ෂිත සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමේ ඉඩ පහසුව සැලසීම.

(ආ) නගරවල අලංකාරය සහ ජන ජීවිතය ඉහළ නැංවීම.

(ඇ) ප්‍රාදේශීය සභාවලට ආදායමක් ලැබීම.

(ඈ) පරිසරය පවිත්‍රව තබා ගැනීමෙන් ලෙඩ රෝග පැතිරීම අවම කිරීම.

### 2.1.1.7 ආදාහනාගාරවලින් අපේක්ෂිත අරමුණු

(අ) අඩු වියදමකින් මෘතදේහ ආදාහනය කිරීමෙන් ප්‍රදේශවාසීන්ට ආර්ථික වශයෙන් සහනයක් සැලසීම.

(ආ) බල ප්‍රදේශයෙන් බැහැර පදිංචිකරුවන්ට ද සේවය ලබාදීමෙන් ප්‍රාදේශීය සභාවට ආදායමක් ලැබීම.

(ඇ) මෘතදේහ දහනය කිරීම සඳහා රක්ෂිත වනාන්තරවලින් දර ලබාගැනීම අවම කිරීම.

## 2.1.2 පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයෙහි දක්වා ඇති පළාත් සභා ලැයිස්තුවේ 4වන ඡේදය අනුව පළාත් පාලනය පළාත් සභා විෂයයක් වේ. එසේ වුව ද පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධ රජයේ කටයුතු මෙන් ම උක්ත ව්‍යවස්ථාවේ සංවෘත ලැයිස්තුවේ දක්වා ඇති පරිදි විදේශ කටයුතු පළාත් සභාවලට අවුරා තැබීම හේතුවෙන් විදේශීය ණය මගින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා විධායක නියෝජිතායතනය ලෙස ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව නිසා මධ්‍යම රජයේ අමාත්‍යාංශයක අවශ්‍යතාව පවතී.

නීතිය අනුව කුමක් සඳහන් වුව ද මේ වන විට මධ්‍යම රජයේ අමාත්‍යාංශයක් වන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඍජුව ම පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනවල එකඟතාව ලබා ගෙන ක්‍රියාත්මක කිරීම තුළින් ඇතිවිය හැකි ගැටළු නිරාකරණය කර ගැනීමට උත්සාහ දරා ඇත.

### 2.1.3 ප්‍රාදේශීය සභා

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් කුඩා ම පළාත් පාලන ආයතනය වූ ප්‍රාදේශීය සභාව 1987 අංක 15 දරන පනත මගින් ස්ථාපිත කරනු ලැබූ අතර ප්‍රාදේශීය සභා 276ක් මේ වන විට ක්‍රියාත්මක වේ. මෙම පළාත් පාලන ආයතන අතුරින් උතුරු හා නැගෙනහිර පළාත්වල පළාත් පාලන ආයතන දියුණු කිරීම සඳහා "උතුරු-නැගෙනහිර පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය" ක්‍රියාත්මක විය. එමගින් එම පළාත් දෙකේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කළ අතර "පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)" මගින් උතුරු හා නැගෙනහිර හැර අනෙකුත් පළාත් 7හි පළාත් පාලන ආයතන දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සභා 108ක් තෝරාගෙන තිබුණි.

## 2.2 විගණනය සඳහා අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 3(1) (ඈ), 5(2), 12(ඌ) වගන්ති ප්‍රකාරව මාගේ විධානය යටතේ මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදී.

## 2.3 මාතෘකාව තෝරා ගැනීමේ පදනම

විදේශ ණය මුදල් භාවිතයෙන් ඉදිකිරීම් නිමකර අදාළ පළාත් පාලන ආයතනවලට වත්කම් පැවරීම සිදු කළ ද ව්‍යාපෘති කාලය අවසන් වීමත් සමඟ ව්‍යාපෘති කාර්යාල වසා දැමෙන බැවින් එම ව්‍යාපෘති පිළිබඳ පසු විපරමක් සිදු නොකෙරේ. පුරනැගුම ව්‍යාපෘතිය විගණනයේදී අනාවරණය වූ කරුණු මෙන් ම පුවත්පත්වල පළ වූ තොරතුරු අනුව ද මහජන නියෝජනයන් පිළිබඳව ද අවධානය යොමු කිරීමේදී අසාර්ථක හෝ අර්ධ වශයෙන් අසාර්ථක උප ව්‍යාපෘති පවතින බව නිරීක්ෂණය වී තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටු වී තිබේ ද, ඉටු වී නොමැති නම් එයට හේතු කවරේ ද, යන්න හා සිදුකර ඇති ආයෝජනයන් ප්‍රතිලාභ ලැබීමේ මාර්ගයට හරවා ගත හැකි ද යන්නත් අධ්‍යයනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම මාතෘකාව තෝරා ගැනීම සඳහා පදනම් විය.

## 2.4 විගණන විෂය පථය

මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතවලට (ISSAI 3000 – 3200) අනුරූපීව මාගේ විගණනය සිදු කරන ලදී.

මෙම විගණනයේදී ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කරන ලද 2011 අගෝස්තු ව්‍යාපෘති කළමනාකරණ කාර්ය සංග්‍රහය, ප්‍රසම්පාදන උපදෙස් සංග්‍රහය හා ආසියානු සංවර්ධන

බැංකුවේ එකඟතාව සහිතව පත් කර ගත් උපදේශක සමාගම් විසින් සකස් කර ඉදිරිපත් කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තා පදනම් කර ගන්නා ලදී.

## 2.5 මෙම විගණනයේ අරමුණු

පහත කරුණු සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කිරීම මෙම කාර්යසාධන විගණනයේ අරමුණු විය.

i. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම්වලින් අපේක්ෂිත ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ ලැබේ ද?
ii. දැනට ලැබෙන ප්‍රතිලාභ පිරිවැයට සාපේක්ෂව ප්‍රමාණවත් ද?
iii. අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා පවතින බාධාවන් කවරේ ද?
iv. අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා තවදුරටත් වැඩිදියුණු කිරීම් අවශ්‍ය ද, ඒ සඳහා ප්‍රතිපාදන සපයා ගත හැකි මාර්ග පවතී ද?

## 3. විගණන නිරීක්ෂණ

## 3.1 සැලසුම් කිරීම

### 3.1.1 මූලික අධ්‍යයනයන්

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතු අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ව්‍යාපෘති කළමනාකරණ කාර්ය සංග්‍රහයේ සඳහන් නිර්ණායකවලට අනුකූලව උප ව්‍යාපෘති තීරණය කළ බවට සාකච්ඡාවලදී තොරතුරු ඉදිරිපත් වුව ද එම කමිටුවේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු හා තෝරා ගැනීම සඳහා සලකා බලන ලද යෝජනා කවරේ ද යන්නත්, එම යෝජනා ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද යන්නත් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

පළාත් සභා මට්ටමෙන් සහ පළාත් පාලන ආයතන මට්ටමෙන් දිගුකාලීන සංවර්ධන සැලසුම් සකස් කර නොතිබූ අතර හෝ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ප්‍රමුඛතා පිළිවෙලට ලැයිස්තුගත කිරීමක් සිදු කර තිබූ බවට ද තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

පුරනැගුම ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති ලෙස තීරණය කළ සංවර්ධන යෝජනා ක්‍රම සැලසුම් කිරීමට පෞද්ගලික ඉදිකිරීම් උපදේශක ආයතන වෙත පවරා තිබූ අතර එම උපදේශක ආයතන විසින් ආර්ථික විශ්ලේෂණ, සමාජ විශ්ලේෂණ හා පරිසර විශ්ලේෂණ සකස් කරනු ලැබ තිබුණි. මෙම අධ්‍යයනයන් පදනම් කරගෙන කමිටුව මගින් තෝරා ගනු ලැබූ කිසිම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී ආර්ථික හෝ සමාජයීය වශයෙන් ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණවත් නොවීම මත ප්‍රතික්ෂේප කිරීමක් ද සිදු කර නොතිබුණි.

### 3.1.2 සංයුක්ත සැලැස්ම

ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහය මඟින් ව්‍යාපෘතියේ සම්පූර්ණ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිලි සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. එහි ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Implementation plan) අනුව

i. 2011 වර්ෂයේ අවසාන කාර්තුවේදී උප ව්‍යාපෘති හඳුනා ගැනීම
ii. 2013 වර්ෂයේ අවසන් කාර්තුව තුළ ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් ප්‍රදානයන් අවසන් කිරීම
iii. 2014 වර්ෂය අවසාන වන විට සියලු ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම

සිදු කළ යුතුව තිබුණි. (ඇමුණුම 01 - Overall Project Implementation Plan)

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට සියලු උපව්‍යාපෘති නිම කළ යුතු වුවත් වටිනාකම රු.මිලියන 843.74 ක් වූ උපව්‍යාපෘති 20ක ඉදිකිරීම් කටයුතු දින 05 සිට දින 377 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් සහිතව නිමකර තිබූ බව නිරීක්ෂණය විය. (ඇමුණුම 02)

ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයත්, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදයත් හේතුවෙන් 2015 ජූනි 30 සිට 2017 ජූනි 30 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදු වී තිබුණි.

### 3.1.3 ක්‍රියාකාරී සැලැස්ම

ව්‍යාපෘති කාර්යාලය විසින් වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද, ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහයෙන් කාල වකවානු සහිතව ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුකූල වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබුණි.

### 3.1.4 මූල්‍ය සැලැස්ම

ව්‍යාපෘති කළමනාකරණ කාර්යසංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ පිරිවැය හා මූල්‍ය ඡේදය මඟින් සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ම මූල්‍ය සැලැස්මක් ඉදිරිපත් කර තිබුණි. (ඇමුණුම 03)


ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යමණ්ඩල වැටුප් ගෙවීම, කාර්යාල වියදම්, කාල පදනමට ව්‍යාපෘති ඉදිකිරීම් අධීක්ෂණ උපදේශක සමාගම්වලට ගෙවීම් ඇතුළු අතිරේක වියදම් දැරීමට සිදුව තිබුණි.

## 3.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 3.2.1 ව්‍යාපෘතිය හා උප ව්‍යාපෘති ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

2011 ඔක්තෝම්බර් 21 දින ව්‍යාපෘති ගිවිසුමට එළඹුණ ද මාස 08ක ප්‍රමාදයකින් පසු 2012 ජූලි මාසයේ ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණි. කෙසේ වුව ද ආරම්භක ප්‍රමාදය මඟහරවා

ගනිමින් ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කරනවා වෙනුවට උප ව්‍යාපෘති ප්‍රසම්පාදන කටයුතු සහ ඉදිකිරීම් ආරම්භ කිරීම ද ප්‍රමාද වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොතිබූ අතර සමස්ත ප්‍රසම්පාදනය 2014 වර්ෂයේ පළමු කාර්තුව තුළ අවසන් කළ යුතුව තිබුණ ද එම කාර්යය 2016 වර්ෂයේ තුන්වන කාර්තුව දක්වා ප්‍රමාද වී පැවතුණි. විස්තර පහත දැක්වේ.





### 3.2.2 උපව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

ප්‍රසම්පාදනයෙන් පසුව ඉදිකිරීම් කොන්ත්‍රාත් ආරම්භ කළ ද නියමිත කාලය තුළ වැඩ අවසන් කර භාර දී නොතිබුණු අතර ඉදිකිරීම් ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව 2012, 2014 සහ 2015 යන වර්ෂවල පිළිවෙලින් නියමිත කාර්තුවල උප ව්‍යාපෘති 1ක්, 35ක් සහ 122ක් නිම කළ යුතුව තිබූ නමුත් නිම කිරීමේදී උප ව්‍යාපෘති 1ක, 14ක සහ 55ක ඉදිකිරීම් නිම කිරීම ප්‍රමාද වී තිබුණි.

| අනු අංකය | කාර්තුව | වැඩ අවසන් කළයුතු ව්‍යාපෘති ගණන | වැඩ අවසන් කළ වැඩ ගණන | වෙනස |
|---|---|---|---|---|
| 1 | 2012 I | 1 | 0 | (1) |
| 2 | 2014 I | 3 | 2 | (1) |
| 3 | 2014 II | 8 | 3 | (5) |
| 4 | 2014 III | 7 | 5 | (2) |
| 5 | 2014 IV | 17 | 11 | (6) |
| 6 | 2015 I | 30 | 16 | (14) |

| | | | | |
|---|---|---|---|---|
| 7 | 2015 II | 41 | 12 | (29) |
| 8 | 2015 III | 33 | 21 | (12) |
| 9 | 2015 IV | 18 | 25 | 7 |
| 10 | 2016 I | 7 | 22 | 15 |
| 11 | 2016 II | 4 | 16 | 12 |
| 12 | 2016 III | 2 | 13 | 11 |
| 13 | 2016 IV | 6 | 11 | 5 |
| 14 | 2017 I | 0 | 12 | 12 |
| 15 | 2017 II | 0 | 7 | 7 |
| 16 | 2018 I | 0 | 1 | 1 |




### 3.2.3 උප ව්‍යාපෘති සැලසුම් හා ඉදිකිරීම්වල යෝග්‍යතාව

විගණන නියැදි පරීක්ෂාවේදී උප ව්‍යාපෘති සැලසුම්වල හා ඉදිකිරීම්වල පවතින අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් එම ඉදිකිරීම්වල පැවැත්මට තර්ජනයක් එල්ල වී තිබූ අතර නඩත්තු වියදම් ඉහළ යා හැකි බව ද නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

**(අ). මාවතගම බස් නැවතුම්පොළ**

i. අඩක් නිම කළ බස් නැවතුම්පොළ ගොඩනැගිල්ලේ වානේ ආකෘතිය මත පිහිටි කොන්ක්‍රීට් තට්ටුව තුළින් ජලය කාන්දු වීම වැළැක්වීම සඳහා ජල ආරක්ෂණ ප්‍රතිකර්ම (Waterproofing) නොයෙදීම නිසා ජලය කාන්දු වීමෙන් වානේ ආකෘතිය මළ බැඳීමට ලක්ව තිබුණි.

ii. වැසිකිළි සඳහා පිරිසිදු ජලය සපයා නොතිබුණු අතර භාවිත කරන ලද අපිරිසිදු ජලය හේතුවෙන් සවි කර තිබුණු සංවේදක (Sensor) අක්‍රීය වී තිබූ අතර වැසිකිළි කොමොඩ් සහ සෝදන බේසම් (සින්ක්) සියල්ල දුර්වර්ණ වී තිබුණි.



**(ආ). රෙමුණ ජල යෝජනා ක්‍රමය**

ජලය රහිත උස් බිමක පිහිටි රෙමුණ ගම්මානයේ පදිංචි පවුල් 72කට පානීය ජලය ලබා දීම සඳහා ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ලබා ගන්නා ජලය කඳු මුදුනේ පිහිටි බෙදාහැරීමේ ටැංකියට පොම්ප කිරීමට තෙකලා විදුලි සැපයුමකින් ක්‍රියාත්මක වන මෝටර් සවි කර තිබුණ ද, ලබාගෙන ඇති තෙකලා විදුලි සම්බන්ධතාවෙන් ප්‍රමාණවත් විදුලි ධාරාවක් එම ස්ථානයට නොලැබීම නිසා ප්‍රමාණවත් ජල සැපයීමක් ලබා දීමට අසමත් වී ඇති බව නිරීක්ෂණය විය.

**(ඇ). උඩපළාත ජල යෝජනා ක්‍රමය**

ස්වාභාවික ජල මාර්ගයක් භාවිතයෙන් අදියර තුනක් යටතේ රු.මිලියන 183.54ක වියදමෙන් මෙම ජල ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබුණ ද ඉදිකිරීමේදී සිදුව තිබූ අඩුපාඩු නිවැරදි කිරීමකින් තොරව 2018 ජනවාරි 11 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.



i. මෙම ජල ව්‍යාපෘතිය සඳහා ජලය ලබා ගන්නා ස්ථානයට වැලි එක්රැස් වන බව ව්‍යාපෘතිය නිම කර භාර දීමටත් පෙර විගණනයෙන් පෙන්වා දී තිබුණු අතර එම ගැටළුවට පිළියම් යෙදීමට හා විල්ගමුව හා උඩුදුම්බර යන ජල ව්‍යාපෘතිවල අඩුපාඩු සකස් කිරීම සඳහා පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ (අතිරේක ප්‍රතිපාදන)

ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 102.29ක කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුම්ගතව තිබුණු බව නිරීක්ෂණය විය.

ii. ජලය ලබාගන්නා ස්ථානයට ඉහළින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අයත් පිරිපහදු කිරීමේ හා බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් පවතින අතර එම ජල සම්පාදන ක්‍රමය ම වැඩිදියුණු කිරීමට අවධානය යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

**(ඈ). වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ විදුලි සෝපානය සවි කිරීම**

රු.මිලියන 3.5ක් වැයකර සවිකරන ලද විදුලි සෝපානය 2017 මාර්තු 08 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණු අතර, විදුලි සෝපානයේ පවතින දෝෂ හේතුවෙන් අක්‍රිය වී ඇත.


1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 සහ 25 වගන්ති යටතේ 2006 ඔක්තෝබර් 17 දින අංක 1467/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසිවල 5(8) a සිට i දක්වා වූ නියමයන් මගින් විදුලි සෝපානයක් ඉදිකිරීමේදී ආබාධ සහිත පුද්ගලයෙකු විදුලි සෝපානයේ ගමන් ගන්නා අවස්ථාවකදී ඔහුට/ඇයට පහසුවෙන් ගමන් කළ හැකි වන ආකාරයට තිබිය යුතු අත්‍යවශ්‍ය පිරිවිතරයන් හඳුන්වා දී තිබුණි. නමුත් මෙම පිරිවිතරයන් කිසිවකට අනුකූල නොවී මෙම විදුලි සෝපානය සවිකර තිබුණු අතර, ඒ බව අවම වශයෙන් රෝද පුටුවක් සෝපානය තුළට ඇතුළත් කිරීමට හෝ නොහැකි වීම තුළින් තහවුරු විය.

මෙම විදුලි සෝපානයේ අඩුපාඩු නිවැරදි කරන ලෙස 2017 මාර්තු 14 දින සිට ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් ඉල්ලීම් සිදු කළ ද ව්‍යාපෘති කාර්යාලය විසින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.3 ව්‍යාපෘතියේ කාර්යසාධනය

### 3.3.1 මූල්‍ය කාර්යසාධනය

2012 ජූලි 01 දින කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතිය 2015 ජූලි 30 දින වන විට අවසන් කළ යුතු වුව ද 2017 ජූනි 30 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කරවා ගෙන තිබූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට ඇමරිකානු ඩොලර් මිලියන 52.77ක් පහත පරිදි උපයෝජනය කර තිබුණි.




### 3.3.2 භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතියේ අරමුණුවලට අනුව පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සහ අනෙකුත් ප්‍රජා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණු වෙනුවෙන් තෝරා ගනු ලැබූ පළාත් පාලන ආයතන 108හි ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ඉදිකිරීමේ ස්වභාවය | සම්බන්ධ වී සිටින පළාත් පාලන ආයතන සංඛ්‍යාව | උප ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| පරිපාලන ගොඩනැගිලි | 39 | 40 |
| යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 21 | 21 |
| ප්‍රජා පහසුකම් වැඩිදියුණු කිරීම | 80 | 89 |
| ජල සම්පාදන ව්‍යාපෘති | 18 | 25 |
| වෙනත් | 03 | 03 |
| | | 178 |

### 3.3.2.1 නිශ්කාර්ය උප ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 332.19ක වියදමෙන් ඉදිකරන ලද බස් නැවතුම් පොළවල් 04ක්, ජල සම්පාදන ව්‍යාපෘති 04ක්, බහුකාර්ය ගොඩනැගිලි 02ක් සහ සනීපාරක්ෂක මධ්‍යස්ථාන 03ක් අදාළ පළාත් පාලන ආයතන වෙත භාර දී තිබූ අතර සම්පූර්ණයෙන් ම නිශ්ක්‍රියව පැවතුණු එම ව්‍යාපෘති පහත පරිදි වේ. එම ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මතු දැක්වේ.

| අ.අ | උප ව්‍යාපෘති | වියදම රු.මිලියන |
|---|---|---|
| 1 | වනාතවිල්ලුව ජල යෝජනා ක්‍රමය | 57.97 |
| 2 | විල්ගමුව ජල යෝජනා ක්‍රමය | 57.19 |
| 3 | මදුරාවල ප්‍රාදේශීය සභාවේ දික්ලන්ද ජල යෝජනා ක්‍රමය | 26.83 |
| 4 | මහව පොල්පිතිගම ජල යෝජනා ක්‍රමය | 14.62 |
| 5 | රිදීගම බස් නැවතුම්පොළ | 43.49 |
| 6 | මීගහකිවුල බස් නැවතුම්පොළ | 33.51 |
| 7 | කිරම බස් නැවතුම්පොළ | 31.11 |
| 8 | ලංකාපුර බස් නැවතුම්පොළ | 11.33 |
| 9 | ඉඹුල්පේ බහුකාර්ය ගොඩනැගිල්ල | 34.08 |
| 10 | හල්දුම්මුල්ල බහුකාර්ය ගොඩනැගිල්ල | 12.46 |
| 11 | ඉපලෝගම,පලාගල,තිරප්පනේ සනීපාරක්ෂක මධ්‍යස්ථාන | 9.60 |
| | **එකතුව** | **332.19** |

**(අ). වනාතවිල්ලුව ජල යෝජනා ක්‍රමය**

රු.මිලියන 57.94ක් වැය කරමින් නිම කර 2017 ජූනි 30 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ මෙම ජල ව්‍යාපෘතිය සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා ගන්නා ජලය නළ මගින් භූගත ටැංකිවලට (Reserve) රැස් කර පාරිභෝගිකයන් වෙත බෙදා හැරීමට නියමිතව තිබුණි. එයින් ගඟේවාඩිය ප්‍රදේශයේ පවුල් 80ක් සඳහා $24m^3$ ක් ද, නාවික හමුදා කඳවුර සඳහා $38m^3$ක් ද, අලුත් එළුවන්කුලම, පරණ එළුවන්කුලම හා රාල් මඩුව යන ගම් 03හි පවුල් 670ක් සඳහා $450m^3$ක් ද ලෙස ජලය $512m^3$ක් ලබාදීම සඳහා සැලසුම්කර තිබුණි.

මේ වන විට ජල සම්බන්ධතාවය ලබා දීම සඳහා රු.මිලියන 8.2 ක අතිරේක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ජලනළ උපාංග හා කාණු කැපීම, නළ එළීම ඇතුළු කටයුතු සඳහා ජල සම්පාදන මණ්ඩලය සහ මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී මුදල් ගෙවා තිබුණි. එහෙත් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ජල ඒකකයක් වැට් බදු හා සේවා ගාස්තු එකතු කර රු. 18 කට, ප්‍රාදේශීය සභාවට ලබා දීමට තීරණය කර තිබුණ අතර, ප්‍රාදේශීය සභාව විසින් සභාවේ නඩත්තු සහ වෙනත් සේවා ගාස්තු ද එකතු කිරීමෙන් පසු ජල ඒකකයක් රු. 35 කට වඩා වැඩි මිලකට පාරිභෝගිකයන්ට අලෙවි කිරීමට සිදු වන බැවින් ජලය බෙදා හැරීම ආරම්භ කර නොතිබුණි. එබැවින් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැති වීම හේතුවෙන් ජල සම්බන්ධතාව අපේක්ෂා කළ මහජනතාව වසර පුරාම උග්‍ර පානීය ජල හිඟයකට ලක්ව සිටින බව,

ii. ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය වියදම රු.මිලියන 2.25කින් අඩු කිරීමට අපේක්ෂා කළ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම අපේක්ෂාව ඉටු වී නොමැති බව,

iii. ජලය සපයා ගැනීමට දැරීමට සිදුවන වියදම රු.මිලියන 2.21කින් අඩු කිරීම තුළින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කළ ද එම අරමුණ ඉටු වී නොතිබුණු බව,

iv. වකුගඩු රෝග නිවාරණය සඳහා පිළියමක් සැපයීමට අපේක්ෂා කළ ද එය ද ඉටු වී නොමැති බව.

v. ප්‍රාදේශීය සභාවට ජලය සැපයීම තුළින් රු.මිලියන 1.4ක ලාභයක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද එය ද ඉටු වී නොතිබුණු බව.

**(ආ). විල්ගමුව ජල යෝජනා ක්‍රමය**

විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෙට්ටිපොළ පානීය ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා රු.මිලියන 57.19ක් වැය කර තිබුණු අතර ඉදිකිරීම නිම කර 2017 ජූනි 30 දින ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ ළිඳකින් ලබා ගන්නා ජලය පිරිපහදු කිරීමෙන් අනතුරුව භූගත ටැංකියක ගබඩා කර, එම ටැංකියේ සිට කුළුණු මත පිහිටි පැරණි බෙදා හැරීමේ ටැංකියට පොම්ප කර බෙදා හැරීමට සැලසුම් කර තිබුණි.

i. මධ්‍යම පළාතට අයත් ප්‍රදේශයක් වුව ද ඊසාන දිග මෝසමේදී සාමාන්‍යයෙන් වියළි කලාපයට ලැබෙන ප්‍රමාණයේ වර්ෂාපතනයකින් යුක්ත වන බැවින් වසරේ වැඩි කාලයක් වැව් හා ඇළදොළ සිඳී යාම පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයේදී සැලකිල්ලක් දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

ii. ඉදිකරන ලද ළිඳෙහි වසරේ වැඩි කාලයක් ජලය නොමැති වීමෙන් අපේක්ෂිත පවුල් 500 සඳහා ජලය ලබාදීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

iii. ව්‍යාපෘතිය සඳහා ආයෝජිත මුදලෙන් ප්‍රදේශයේ ජනතාවට හෝ ප්‍රාදේශීය සභාවට කිසිදු ආර්ථික හෝ සාමාජයීය වශයෙන් ප්‍රතිලාභයක් නොලැබීමෙන් මෙම ව්‍යාපෘතිය සඳහා නිශ්කාර්ය වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය. ළිඳෙන් අපේක්ෂිත ජල මට්ටම ලබා ගැනීම සඳහා තවදුරටත් කළ යුතු වැඩිදියුණු කිරීම් පිළිබඳ කිසිදු තාක්ෂණික අධ්‍යයනයක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

**(ඇ). මදුරාවල ප්‍රාදේශීය සභාව - රෙමුණ හා දික්ලන්ද ජල ව්‍යාපෘති**

මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දික්ලන්ද ගමෙහි පවුල් 25කටත්, රෙමුණ ගම්මානයේ පවුල් 150කටත් දිනකට පානීය ජලය 60m$^3$ක් ලබාදීම සඳහා රු.මිලියන 26.83ක වියදමෙන් ජල යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක කර තිබුණි. මෙම

ව්‍යාපෘති 2016 සැප්තැම්බර් 15 දින වැඩ අවසන් කොට 2016 ඔක්තෝබර් 10 දින ප්‍රාදේශීය සභාවට භාර දී ඇත.

i. දික්ලන්ද ජල ව්‍යාපෘතියට ජලය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව සතු පොදු ළිඳක් වැඩිදියුණු කර තිබුණු අතර පසුව කරන ලද පරීක්ෂාවේදී එම ජලයේ බැක්ටීරියා වර්ධනය ඉහළ මට්ටමක පැවතුණි. පොදු ළිඳ පිහිටි ස්ථානයට ඉතා ළංව පිහිටි නිවාස සහ වැසිකිළි මගින් ළිං ජලයට අපජලය එකතු වන්නේ ද යන්න පිළිබඳ ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබීම නිසා ළිඳ සංවර්ධනය කිරීම, නළ එළීම, ජල ටැංකි සවි කිරීම, බෙදා හැරීම් මෙන් ම ජල මීටර් සවිකිරීම සඳහා වූ සම්පූර්ණ වියදම නිශ්කාර්යය වී ඇති බව නිරීක්ෂණය විය.

ii. ජල බිල්පත් මගින් ලබන ආදායමෙන් සියලු වියදම් පියවා ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශීය සභාවට ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද එවැනි ආදායමක් ලබා නොමැති බව නිරීක්ෂණය විය.

**(ඇ). මහව පොල්පිතිගම ජල සැපයුම් පද්ධතිය**

වකුගඩු ආශ්‍රිත රෝග පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති මහව ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශයකට හා පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශයකට පානීය ජලය පමණක් ලබා දීම සඳහා පොලිමර් ටැංකි ස්ථාපිත කිරීමට රු.මිලියන 14.62ක් වැය කර තිබුණි.





i. උග්‍ර වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් සිටින ප්‍රදේශයක් වන පොල්පිතිගම ප්‍රදේශයේ පවුල් 1,800කට අවශ්‍ය පානීය ජලය සැපයීමට අපේක්ෂා කළ ද ජලය සැපයීමට නොහැකි වීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

ii. ප්‍රදේශය පුරා ස්ථාපිත කර ඇති පොලිමර් ජල ටැංකි 2017 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතීම හේතුවෙන් කැඩීබිඳී යාම හා සතුන් විසින් හානි කිරීමේ අවධානමකට ලක්ව තිබුණි.

iii. ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී රු.මිලියන 7.78ක වාර්ෂික ආදායමක් ප්‍රාදේශීය සභාවට ලබා ගත හැකි යැයි අපේක්ෂා කළ ද කිසිදු ආදායමක් ප්‍රාදේශීය සභාවට ලබාගත නොහැකි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

iv. කෝන් වැව පිහිටි ජල සැපයුම් මධ්‍යස්ථානයේ සිට කි.මී.35ක් දුරින් පිහිටි පොල්පිතිගම ජල ටැංකිවලට ජලය ලබා දීම සඳහා අවශ්‍ය ලොරි බවුසර් ව්‍යාපෘතිය මගින් සපයා දීමේ එකඟතාවයක් තිබුණ ද ඒ අනුව කටයුතු නොකිරීම ද මෙම ව්‍යාපෘතිය අක්‍රීය වීමට හේතු වී තිබුණි.

**(ඉ) රිදීගම බස් නැවතුම්පොළ**

රු.මිලියන 43.49ක් වැය කර ඉදිකර තිබූ මෙම ගොඩනැගිල්ලේ බිම්මහළ බස් නැවතුම්පොළ සඳහා ද, පළමු මහළ ආයුර්වේද හා බටහිර වෛද්‍ය සායන, පෙර පාසල, ආපන ශාලාව හා කියවීම් ශාලාව සඳහා ද, දෙවන මහළ සම්මන්ත්‍රණ ශාලාවක් සඳහා ද යොදා ගැනීමට සැලසුම් කර තිබුණි. 2017 මාර්තු 29 රිදීගම ප්‍රාදේශීය සභාවට ව්‍යාපෘතිය භාර දී තිබුණ ද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන්ව ඇති බිම්මහළ හා පළමු මහළ ද 2019 සැප්තැම්බර් 18 වන විටත් අපේක්ෂිත අරමුණු ලබා ගැනීම සඳහා මහජනතාවට විවෘත කර නොතිබුණි.



i. බස් රථ බලාපොරොත්තුවෙන් සිටින මගී ජනතාවට අසුන් ගෙන සිටීමට සහ ආරක්ෂිතව රැඳී සිටීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා නොතිබුණි.

ii. බස් නැවතුම්පොළ ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් මහජනතාවට ලැබිය යුතු සේවය මෙන් ම ප්‍රාදේශීය සභාවට අපේක්ෂා කළ රු.මිලියන 5.3ක ආදායම් වාර්ෂිකව අහිමි වී තිබුණි.

iii. ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කළ ද සෞඛ්‍ය සායන නොපැවැත්වීම හේතුවෙන් එම අරමුණු ඉටු වී නොතිබුණු අතර ප්‍රදේශවාසීන්ට සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට වෙනත් නගරවලට යාමට සිදු වීමෙන් ඒ සඳහා ගතවන කාලය මෙන් ම වියදම ද අඩු කිරීමට නොහැකි වී තිබුණි.

iv. ගොඩනැගිල්ලේ පළමු මහලේ ආයුර්වේද වෛද්‍ය සායනයක් සඳහා ඉඩකඩ වෙන් කර තිබුණ ද බස් නැවතුම්පොළට සමීපව ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ආයුර්වේද රෝහලක් පවතින බැවින් ආයුර්වේද සායනයක අවශ්‍යතාවක් නොපවතින බව නිරීක්ෂණය විය.

**(ඊ). මීගහකිවුල බස් නැවතුම්පොළ**

මෙම බස් නැවතුම්පොළ හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා රු.මිලියන 33.51ක් වැය කර තිබුණු අතර ඉදිකිරීම් අවසන් කර 2017 අප්‍රේල් 24 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.





i. මෙම බස් නැවතුම්පොළ ඉදිකිරීමට පෙර සකස් කළ යුතු ආර්ථික හා සමාජයීය ශක්‍යතා අධ්‍යයන වාර්තා විගණනයට ඉදිරිපත් නොවීමෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු කවරේද යන්න විගණනයෙන් හඳුනාගත නොහැකි විය.

ii. මීගහකිවුල නගරය හරහා ගමන් කරන ප්‍රධාන මාර්ගය වූ බදුල්ල - මහියංගනය මාර්ගයෙන් බැහැර ප්‍රදේශයක, ප්‍රවේශ මාර්ගය රහිතව හා ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් පවරා ගැනීමකින් තොරව බස් නැවතුම්පොළ ඉදිකිරීම නිසා ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාවට භාර දුන් 2017 අප්‍රේල් 24 දිනයේ සිට මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

iii. ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා සභාව සතුව ප්‍රතිපාදන නොමැති වීමත්, විගණිත දිනය වන විට බාහිර පාර්ශ්වයන්ගෙන් ද ප්‍රතිපාදන සපයාගෙන නොමැති වීමත්

නිසා බස් නැවතුම්පොළ ප්‍රයෝජනයට ගැනීම අවිනිශ්චිතව පවතින බව නිරීක්ෂණය විය.

iv. බස්රථ නැවතුම්පොළ විවෘත නොකිරීම නිසා මාර්ගය දෙපස බස්රථ නවතා තැබීමට සිදුවීමෙන් මාර්ගය අවහිර වන බව නිරීක්ෂණය විය.

v. යෝජිත කඩකාමර බදු දීමට නොහැකි වීමෙන් අපේක්ෂිත ආදායම සභාවට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

vi. මෙම බස් නැවතුම්පොළ ප්‍රයෝජනයට ගත නොහැකි වීමෙන් බස් නැවතුම්පොළින් ගමන් ආරම්භ කිරීමට හා බස්රථ නැවතුම්පොළ හරහා ගමන් කිරීමට යෝජිතව තිබූ ගමනාන්තයන් සඳහා බස්රථ බලාපොරොත්තුවෙන් සිටින මගී ජනතාවට ආරක්ෂිතව රැඳී සිටීමට ස්ථානයක් නොමැති බව නිරීක්ෂණය විය.

**(උ). කිරම බස් නැවතුම්පොළ**

රු.මිලියන 31.11ක් වැය කර ඉදිකර තිබූ මෙම ගොඩනැගිල්ලේ බිම්මහල බස් නැවතුම්පොළ හා කඩකාමර 5කින් සහ ඉහළ මහළ ශාලාවකින් සමන්විත වන අතර 2016 මාර්තු 23 දින ඉදිකිරීම් නිම කර ප්‍රාදේශීය සභාවට භාර දීමෙන් පසු 2018 ජනවාරි 02 දින මහජනතාව සඳහා විවෘත කර තිබුණි.



i. මෙම බස් නැවතුම්පොළ ඉදිකිරීමට පෙර සකස් කළ යුතු ආර්ථික හා සමාජයීය ශක්‍යතා අධ්‍යයන වාර්තා විගණනයට ඉදිරිපත් නොවීමෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු කවරේද යන්න විගණනයෙන් හඳුනාගත නොහැකි විය.

ii. කටුවන ප්‍රාදේශීය සභාවට අයත් ග්‍රාමීය ප්‍රදේශයක් වන කිරම ප්‍රදේශය සඳහා දෙමහල් ගොඩනැගිල්ලකින් යුතු බස් නැවතුම්පොළක අවශ්‍යතාවක්

නොපැවති අතර බස් නැවතුමක (Bus Halt) අවශ්‍යතාවක් පමණක් පවතින බව ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

iii. දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත බස් නැවතුම්පොළේ ඉහළ මහල කුමන අරමුණක් සඳහා ඉදි කළේ ද යන්න පැහැදිළි නොවූ අතර ඉදිකිරීම් නිමකර භාර දුන් 2016 මාර්තු 23 දිනයේ සිට කිසිදු කටයුත්තක් සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

iv. බිම් මහලේ බදු දීම සඳහා යෝජිත කඩකාමර 05 බදු නොදී, බස් නැවතුම්පොළට යාබදව සැලැස්මකින් තොරව කඩකාමරයක් ඉදිකිරීමට ප්‍රදේශවාසියෙකුට අවස්ථාව ලබා දී තිබුණි.

v. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩමක ගොඩනැගිල්ල ඉදිකර ඇති අතර ඉදිකිරීමට පෙර ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට හෝ ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොමැති අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මේ වන විට රු.මිලියන 27.5ක තක්සේරු වටිනාකමක් ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා තිබුණි.

vi. සම්පූර්ණ ඉදිකිරීම ම නිශ්කාර්යව පැවතීම නිසා සියලු විදුලි සවිකිරීම් ගලවා ගෙන ගොස් තිබූ අතර අලංකාරය සඳහා ඉදිකර තිබූ විදුලි කණු මළ බැඳීම හේතුවෙන් ඇද වැටී විනාශ වී පැවතුණු බව නිරීක්ෂණය විය.

**(ඍ). ලංකාපුර බස් නැවතුම්පොළ**

රු.මිලියන 11.33ක වියදමෙන් ඉදිකරන ලද මෙම බස් නැවතුම්පොළ 2016 ඔක්තෝබර් 03 දින ඉදිකිරීම් අවසන් කර ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ අතර 2017 පෙබරවාරි 08 දින මහජනතාවට විවෘත කර තිබුණි.



2017 පෙබරවාරි 08 දින බස්නැවතුම්පොළ මහජනතාවට විවෘත කර තිබුණ ද බස් රථ නොපැමිණීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 30 දින වන විටත් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

**(එ) ඉඹුල්පේ බහුකාර්ය ගොඩනැගිල්ල**

පුස්තකාලය, පෙර පාසල, සෞඛ්‍ය මධ්‍යස්ථානය, ආයුර්වේද මධ්‍යස්ථානය හා මාතෘ සායනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 34.08ක වියදමෙන් 2016 සැප්තැම්බර් 25 දින ඉදිකිරීම් නිම කරන ලද මෙම බහුකාර්ය ගොඩනැගිල්ල හා අභ්‍යන්තර මාර්ගය 2017 ජනවාරි 03 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

ප්‍රධාන මාර්ගයේ සිට කි.මී.2ක් පමණ දුරින් පොදු ප්‍රවාහන සේවාවන් රහිත ස්ථානයක පිහිටා ඇති මෙම ගොඩනැගිල්ලෙන් මේ දක්වා කිසිදු ප්‍රයෝජනයක් ලබා නොමැත. ඉතා අලංකාර පරිසරයක පිහිටා ඇති ගොඩනැගිල්ල උත්සව ශාලාවක් සහ හෝටල් ව්‍යාපාරයක් සඳහා බදුදීමට ප්‍රාදේශීය සභාව විසින් පසුගිය කාල පරිච්ඡේදය තුළ උත්සාහ දරා ඇති බවට නිරීක්ෂණය වුව ද මෙම ව්‍යාපෘතිය මගින් කිසිදු සමාජ ප්‍රතිලාභයක් හෝ ප්‍රාදේශීය සභාවෙහි ආදායම් වර්ධනයක් සිදු වී නොමැති බැවින් නිශ්කාර්ය ඉදිකිරීමක් බව නිරීක්ෂණය විය.

**(ඒ). හල්දුම්මුල්ල බහුකාර්ය ගොඩනැගිල්ල**

ශ්‍රවණාගාරයක්, ආයුර්වේද වෛද්‍ය සායනයක්, ළමා හා මාතෘ සායනයක් පැවැත්වීම සඳහා සැලසුම් කර රු. මිලියන 12.46ක වියදමකින් ඉදි කරන ලද මෙම ගොඩනැගිල්ල 2014 නොවැම්බර් 25 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

i. ළමා හා මාතෘ සායනය මගින් වර්ෂයකට මව්වරුන් 200කට හා ළමයින් 150කට ද, ආයුර්වේද සායනය මගින් වර්ෂයකට පුද්ගලයින් 1,200කට ද සේවා සැපයීමට සැලසුම් කර තිබුණු අතර එයින් ලැබිය හැකි වාර්ෂික ප්‍රතිලාභය රු.710,000ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් ළමා හා මාතෘ සායන පවත්වා ගෙන ගොස් නොතිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලබන බව නිරීක්ෂණය විය.

ii. උත්සව ශාලාව විවාහ උත්සව සඳහා කුලියට දීමෙන් හා සංචාරකයන් සඳහා කාමර කුලියට දීමෙන් රු.780,000ක වාර්ෂික ආදායමක් අපේක්ෂා කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 30 දින වන විට උත්සව ශාලාව කුලියට දීමෙන් රු.15,238ක කුලී ආදායමක් පමණක් ලබා තිබුණු බව නිරීක්ෂණය විය.

iii. අපේක්ෂිත ආදායම් ඉලක්ක හා ප්‍රතිලාභ ලැබී නොමැති බැවින් මෙම ගොඩනැගිල්ල ඵලදායක නොවූ ඉදිකිරීමක් බව නිරීක්ෂණය විය.

**(ඔ). ඉපලෝගම,පලාගල,තිරප්පනේ සනීපාරක්ෂක මධ්‍යස්ථාන**

රු.මිලියන 9.60ක් වැය කර ඉපලෝගම, පළාගල හා තිරප්පනේ සනීපාරක්ෂක මධ්‍යස්ථාන ඉදිකර තිබූ අතර ඒ අතුරින් ඉපලෝගම සනීපාරක්ෂක මධ්‍යස්ථානය සඳහා ජලය නොමැති වීමෙන් නිශ්කාර්යව පැවතුණු අතර පළාගල ප්‍රාදේශීය සභාවට අයත් ආඩියාගල ප්‍රදේශයේ ඉදිකර තිබූ සනීපාරක්ෂක මධ්‍යස්ථානය භාවිත කිරීම සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති වීමෙන් නිශ්කාර්යව පැවතුණි.

### 3.3.2.2 ඌන උපයෝජිත උප ව්‍යාපෘති

රු.මිලියන 513.73ක වියදමෙන් ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි 12ක් ද, රු.මිලියන18.90ක වියදමෙන් ඉදිකරන ලද පුස්තකාලයක් ද, රු.මිලියන 105.06ක වියදමෙන් ඉදිකරන ලද සතිපොළවල් 03ක් ද විවිධ හේතු මත ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහත දැක්වේ.

**(අ). රඹෑව බහුකාර්ය ගොඩනැගිල්ල**

ශ්‍රවණාගාරය සහ පුස්තකාලය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 28.00ක වියදමෙන් 2015 මාර්තු 15 දින ඉදිකිරීම් නිම කරන ලද මෙම ගොඩනැගිල්ල 2015 මැයි 15 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

i. ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පවතින අතර ශ්‍රවණාගාරය කුලියට දීමෙන් මාසයකට රු.310,000ක ආදායමක් අපේක්ෂා කර තිබුණ ද විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ගොඩනැගිල්ල මහජනතාවට විවෘත කළ 2015 මැයි 15 දින සිට 2019 ඔක්තෝබර් 31 දින දක්වා ලබාගත් මුළු ආදායම රු.52,500ක් වූ බැවින් ශ්‍රවණාගාරයෙන් ලබා ගත් සාමාන්‍ය මාසික කුලී ආදායම රු.1,010ක් විය. එබැවින් ශ්‍රවණාගාරය ඉදිකිරීමෙන් අපේක්ෂිත ආදායම් ඉලක්කය ළඟා කර ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

ii. පුස්තකාලය පවත්වා ගැනීමෙන් පාඨක සාමාජිකත්ව 500ක් හා එමගින් රු.12,500ක ආදායමක් ලබාගැනීමට අපේක්ෂා කර තිබූ අතර විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව පුස්තකාලයෙන් ලබා ගත් සාමාන්‍ය මාසික කුලී ආදායම රු.816ක් වූයෙන් අපේක්ෂිත ආදායම් ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. පුස්තකාලයේ 2019 ඔක්තෝබර් 31 දිනට ළමා සාමාජිකත්වය 76ක් හා වැඩිහිටි සාමාජිකත්වය 122ක් වන අතර දෛනිකව

පුස්තකාලය භාවිත කරන්නන්ගේ සංඛ්‍යාව ද ඉතා අල්ප වී ඇති බැවින් පුස්තකාලය භාවිතය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන ව්‍යාපෘතිය සැලසුම් කර ඇති බව නිරීක්ෂණය කෙරේ.

iii. මෙම ප්‍රදේශයේ මෙවැනි ස්වභාවයේ ගොඩනැගිලි නොමැති බැවින් වෙනත් රාජ්‍ය ආයතන, ව්‍යාපාරික ප්‍රජාව මෙන් ම සංචාරකයින් ද මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමෙන් එම කණ්ඩායම්වලට හා ප්‍රාදේශීය සභාවට වක්‍ර ප්‍රතිලාභයක් ලැබෙනු ඇති බවට අපේක්ෂා කළ ද එවැනි භාවිතයක් සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

iv. ප්‍රාදේශීය සභාවේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා මෙම ගොඩනැගිල්ල ඉදි කළ ද ගොඩනැගිල්ලේ දෛනික නඩත්තු කිරීම් සඳහා වැයවන මුදල හෝ ආවරණය කර ගැනීමට තරම්වත් ආදායමක් නොලැබෙන බැවින් මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවේ ආර්ථික තත්ත්වය දුර්වල කිරීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

**(ආ). තිරප්පනේ බහුකාර්ය ගොඩනැගිල්ල**

ශ්‍රවණාගාරයක්, ප්‍රදර්ශන ශාලාවක්, අවන්හලක් සහ සාකච්ඡා කාමරයක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 42.51ක වියදමෙන් 2016 ජූනි 06 දින ඉදිකිරීම් නිම කරන ලද මෙම ගොඩනැගිල්ල 2017 ජූලි 14 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

i. ගොඩනැගිල්ලෙන් ¼ක ප්‍රමාණයක් වෛද්‍ය සායනය සඳහා වෙන් කර තිබුණ ද 2019 ඔක්තෝබර් 31 දින වන විටත් එම කොටස නිශ්කාර්යව පැවති අතර බිම් මහලේ පුස්තකාලය පමණක් ක්‍රියාත්මකව පැවතුණි.

ii. ඉහළ මාලයේ පිහිටි ශ්‍රවණාගාරයේ විවිධ සමාජ ක්‍රියාකාරකම් පැවැත්වීමට අපේක්ෂා කර තිබුණු අතර එතුළින් රු.310,000ක මාසික ආදායමක් හා රු.30,000ක මාසික කඩකුලී ආදායමක් බලාපොරොත්තු විය. ගොඩනැගිල්ල මහජන භාවිතය සඳහා ලබාදුන් 2017 ජූලි 14 දින සිට මේ දක්වා ලබා ඇති මුළු ආදායම රු.57,000ක් වන බැවින් සාමාන්‍ය මාසික ආදායම රු.2,280ක් වී තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ල පිරිසිදු කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම හෝ ආවරණය වී නොතිබීමෙන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය පැවති තත්ත්වයටත් වඩා පහළ මට්ටමකට ඇද වැටීමට හේතු වී තිබුණි.

**(ඇ). නාවුල ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල**

ප්‍රදර්ශන හා පුහුණු මධ්‍යස්ථානය, ආයුර්වේද මධ්‍යස්ථානය, බටහිර වෛද්‍ය මධ්‍යස්ථානය, ප්‍රජා මධ්‍යස්ථානය, පුස්තකාලය හා රැස්වීම් ශාලාව සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 50.77ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල 2017 ජනවාරි 03 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

මෙම ගොඩනැගිල්ලෙන් වසරකට ලැබිය හැකි සාමාන්‍ය ප්‍රතිලාභය රු.11,108,438ක් ලෙස තක්සේරු කර තිබූ නමුත් 2018 අගෝස්තු 16 දින තෙක් සම්පූර්ණයෙන් ම නිශ්කාර්යව පැවති මෙම ගොඩනැගිල්ල එදිනෙන් පසුව රැස්වීම් ශාලාව සහා ගර්භය ලෙස භාවිත කිරීම හැරුණු විට වෙනත් කිසිදු කටයුත්තකට භාවිත කර නොතිබුණු බැවින් ඌන උපයෝජිත වත්කමක් ලෙස නිරීක්ෂණය විය.

**(ඈ). මිණිපේ ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල**

සභා කාර්යාලය, සෞඛ්‍ය හා ආයුර්වේද මධ්‍යස්ථානය සහ මාතෘ සායනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 62.35ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල 2017 අප්‍රේල් 05 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

මාතෘ සායනය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේත්, ආයුර්වේද මධ්‍යස්ථානය ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලකත් පවත්වාගෙන යනු ලබන බැවින් ගොඩනැගිල්ලේ එම කාර්යයන් සඳහා වෙන් කළ කොටස් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(ඉ). අඹන්ගඟ කෝරළේ, ගඟවට කෝරළේ සහ තුම්පනේ ප්‍රාදේශීය සභාවල බහුකාර්ය ගොඩනැගිලි**

| ප්‍රාදේශීය සභාව | වියදම (රු.මිලියන) | ඉදිකිරීම් නිම කර භාර දුන් දිනය | විවෘත කළ දිනය |
|---|---|---|---|
| අඹන්ගඟ කෝරළේ | 44.99 | 2015.12.30 | 2016.03.03 |

| | | | |
|---|---|---|---|
| ගඟවට කෝරළේ (ගුරුදෙණිය හා තැන්නේ කුඹුර) | 42.98 | 2015.12.09 | 2015.12.12 |
| තුම්පනේ | 58.50 | 2015.11.18 | 2015.11.18 |

ඉහත සඳහන් බහුකාර්ය ගොඩනැගිලිවල රැස්වීම්ශාලාවලින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්නොවී ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(ඊ). බියගම සහ මදුරාවල බහුකාර්ය ගොඩනැගිලි**

පෙර පාසල, පුස්තකාලය සහ ශ්‍රවණාගාරය සඳහා යොදා ගැනීමට සැලසුම් කර රු.මිලියන 43.42ක වියදමෙන් බියගම ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකරන ලද මාවර මණ්ඩිය තෙමහල් බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉහළ මහලේ පවතින ශ්‍රවණාගාරය ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය වූ අතර ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

ශ්‍රවණාගාරය, ආයුර්වේද වෛද්‍ය සායනය හා මාතෘ සායනය යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 20.62ක වියදමෙන් මදුරාවල ප්‍රාදේශීය සභාව සඳහා ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය ද ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(උ). වළල්ලාවිට බහුකාර්ය ගොඩනැගිල්ල**

පෙර පාසල, පුස්තකාලය සහ ශ්‍රවණාගාරය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 23.84ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කළ 2017 පෙබරවාරි 17 දින සිට මේ දක්වා රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණු බැවින් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(ඌ). වලපනේ ප්‍රාදේශීය සභාවේ රාගල බහුකාර්ය ගොඩනැගිල්ල**

රු.මිලියන 46.71ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලේ පහළ බිම්මහල පොළක් පැවැත්වීමටත්, බිම් මහළ රැස්වීම් ශාලාවක් සඳහාත් යොදා ගැනීමට සැලසුම් කර, සියලු ඉදිකිරීම් නිම කර 2016 ජූනි 22 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණු අතර 2017 අප්‍රේල් 07 දින මහජනතාව සඳහා විවෘත කර තිබුණි.

i. සතිපොළක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් රහිත යටි බිම් මහළ වර්ග මීටර් 521කින් සමන්විත වන අතර ඒ ආසන්නයේ බිම් මහලේ වර්ග මීටර් 575ක ගොඩනැගිල්ල මේ දක්වා ඌන උපයෝජිතව පවතී.

ii. මුළු ගොඩනැගිල්ලම සංචාරක නිකේතනයක ආකාරයෙන් ඉදිකර ඇති බැවින් පොළක් පැවැත්වීම සඳහා නොගැළපෙන බව නිරීක්ෂණය විය.

iii. ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් රැස්වීම් ශාලාවේ උපකරණ ද නිශ්කාර්යව පවතී.

**(එ). නාගොඩ බහුකාර්ය ගොඩනැගිල්ල**

පුස්තකාලය, ආයුර්වේද මධ්‍යස්ථානය, පෙර පාසල, ශ්‍රවණාගාරය සහ මාතෘ සායනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 49.04.ක වියදමෙන් ඉදිකිරීම් කටයුතු නිම කර, 2016 මාර්තු 09 දින නාගොඩ ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ මෙම ගොඩනැගිල්ල 2017 නොවැම්බර් 02 දින මහජනතාව සඳහා විවෘත කර තිබුණි.

i. 1973 වර්ෂයේ ආරම්භ කර පවත්වාගෙන එමින් තිබූ මහජන පුස්තකාලය මෙම ගොඩනැගිල්ලට මාරු කර තිබූ අතර ශ්‍රවණාගාරය දින කිහිපයක් පමණක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. ගොඩනැගිල්ලේ අනෙකුත් ඉඩකඩ වෙන් කරන ලද කාර්යයන් වෙනත් ස්ථානවල පැවැත්වෙන බැවින් එම කොටස් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(ඒ). කල්පිටිය පුස්තකාල ගොඩනැගිල්ල**

පුරනැගුම ව්‍යාපෘතිය මගින් කල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා රු.මිලියන 18.90ක මුදලක් වැය කර නොරොච්චෝලේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කර තිබුණි.





i. පුරනැගුම ව්‍යාපෘතිය මගින් 2017 පෙබරවාරි 27 දින කල්පිටිය ප්‍රාදේශීය සභාවට පුස්තකාල ගොඩනැගිල්ල භාර දී තිබුණු නමුත් වසර 1½කට අධික

කාලයක් ඌන උපයෝජිතව පැවතීමෙන් පසුව 2018 ඔක්තෝබර් 07 දින මහජනතාවට විවෘත කර තිබුණු බව නිරීක්ෂණය විය.

ii. වර්ග අඩි 5,034ක විශාලත්වයකින් යුතු ගොඩනැගිල්ලක් පුස්තකාලය සඳහා ඉදිකර තිබුණ ද විගණිත දිනය වූ 2019 ඔක්තෝබර් 31 දින වන විටත් වර්ග අඩි 1,859ක් එනම් ගොඩනැගිල්ලෙන් සියයට 36.93ක කොටසක් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

iii. ශක්‍යතා අධ්‍යයනයේදී ප්‍රදේශයේ ජනතාවගේ රුචිකත්වය පිළිබඳ තක්සේරු නොකර, පුද්ගලයන් 469ක් පමණ පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගනිමින් ප්‍රතිලාභ ලබා ගනීවි යැයි අපේක්ෂා කළ ද 2019 සැප්තැම්බර් 18 දින වන විටත් පුද්ගලයන් 159ක් පමණ සාමාජිකත්වය ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

iv. පුස්තකාලයෙන් ප්‍රාදේශීය සභාවට වාර්ෂිකව රු.399,000ක ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද පුස්තකාලය භාවිතා කිරීමට පාඨකයන් නොමැති වීම හේතුවෙන් පුස්තකාලය විවෘත කළ දින සිට 2019 ජූනි 30 වන විට රු.50ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

v. කල්පිටිය ප්‍රදේශයේ උග්‍ර පානීය ජල ගැටළුවක් පවතින අතර ප්‍රදේශයේ ජනතාව පෞද්ගලික ව්‍යාපාරිකයන්ගෙන් ජලය මිලදීගෙන ප්‍රයෝජනයට ගන්නා අතර පුරනැගුම ව්‍යාපෘතිය යටතේ සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රදේශයේ අවශ්‍යතාවයන් පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘති තෝරා ගෙන ඇති බව නිරීක්ෂණය විය.

**(ඔ). තිස්සමහාරාම සතිපොළ**

රු.මිලියන 48.48ක් වැය කර ඉදිකරන ලද තිස්සමහාරාම සතිපොළෙහි යාබද මාළු වෙළෙඳපොළ බඳුදීමට ප්‍රාදේශීය සභාව අසමත්ව තිබුණි. ඒ හේතුවෙන් සතිපොළ භූමියෙහි මාළු වෙළෙඳපොළ ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**(ඕ). සූරියවැව සතිපොළ**

රු.මිලියන 44.88ක වියදමෙන් 2016 ජූනි 15 දින ඉදිකිරීම් නිම කර සූරියවැව ප්රාදේශීය සභාවට භාර දෙන ලද මාළු වෙළෙඳපොළ 2019 මැයි 25 දක්වා ඌන උපයෝජිතව පැවති අතර මේ වන විට සම්පූර්ණ ගොඩනැගිල්ල බදු දී තිබුණ ද බදුකරු විසින් ගොඩනැගිල්ල භාවිත නොකර මාර්ගයේ සහ විවෘත භූමියේ වෙළෙඳාම් කටයුතු සිදු කරන බව නිරීක්ෂණය විය.

සතිපොළ භූමිය මාළු වෙළෙඳපොළකින් ද සමන්විත වන අතර වැසි ජලය බැසයාම සඳහා අවශ්‍ය පහසුකම් නොසැලසීම හේතුවෙන් පාරිභෝගිකයින්ගේ හා වෙළෙඳුන්ගේ කටයුතුවලට බාධා වී තිබුණි.




**(ක). රත්තොට සතිපොළ ගොඩනැගිල්ල**

රු.මිලියන 12.06ක වියදමෙන් ඉදිකිරීම් නිම කර 2015 මාර්තු 17 දින රත්තොට ප්‍රාදේශීය සභාවට භාර දී ඇති, සතිපොළ සඳහා ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ල 2019 අප්‍රේල් 08 දින දක්වා ම නිශ්කාර්යව පැවතී අතර 2019 අප්‍රේල් 08 දින ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කොටසක මෙම ප්‍රාදේශීය සභාවේ පුස්තකාලය ස්ථාපිත කර ඇත. සතිපොළක් නොපැවැත්වෙන ප්‍රදේශයක් බැවින් සතිපොළක අවශ්‍යතාවක් නොවූයෙන් ඌන උපයෝජිතව පැවති බිම්මහළ, කඩකාමර ලෙස සකස් කර බදු දීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් රු.මිලියන 1.5ක් වැය කර තිබුණ ද එම කඩකාමර 2020 දෙසැම්බර් 31 දින දක්වාම ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

### 3.3.2.3 අපේක්ෂිත ප්‍රතිලාභ නොමැති උප ව්‍යාපෘති

මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් නිමකර පළාත් පාලන ආයතනවලට භාර දෙන ලද උප ව්‍යාපෘති අතුරින් උපව්‍යාපෘති 16කින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී තිබූ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

**(අ). මාවතගම බස් නැවතුම්පොළ**

සේවා පහසුකම් ගොඩනැගිල්ල සහ මහජන වැසිකිළි පද්ධතිය සමඟ ඉදිකිරීමට සැලසුම් කර තිබූ මෙම බස් නැවතුම්පොළ රු. මිලියන 43.79ක වියදමෙන් 2016 දෙසැම්බර් 02 දින ඉදිකිරීම් අවසන් කර, මාවතගම ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.



i. මෙම බස්නැවතුම්පොළ 2018 ඔක්තෝබර් 14 දක්වා මහජනතාව සඳහා විවෘත නොකර නිශ්කාර්යව පැවතුණි.

ii. කඩකාමර කුලී හැර බස් නැවතුම්පොළ භූමියෙන් අපේක්ෂිත වාර්ෂික ආදායම රු.මිලියන 5.70ක් වුවත් මේ වන විට වාර්ෂික ආදායම රු.මිලියන 1.28ක් විය.

iii. මහජනතාවට ආරක්ෂිතව බස් රථවලට නැගීමට සහ බැසීමට අවශ්‍ය පහසුකම් නොමැති බව නිරීක්ෂණය විය.

iv. ඉහළ මහලේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් බස් නැවතුම්පොළෙහි මගී ජනතාවට ආවරණය සැපයීම සඳහා ඉදි කළ යුතු ආවරණ වහළය (Canopy) සකස් කිරීම ද ප්‍රමාද වී ඇත.



**(ආ). උඩුදුම්බර ජල යෝජනා ක්‍රමය**

නකල්ස් රක්ෂිතයෙන් ගලා බසිනා ස්වාභාවික උල්පත් ජලය භාවිතයෙන් මෙම පානීය ජල ව්‍යාපෘතිය රු.මිලියන 41.63ක වියදමෙන් ඉදිකර 2018 ජනවාරි 18 දින ඉදිකිරීම් අඩුපාඩු සහිතව ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි.

i. මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 400කට පිරිපහදු කළ ජලය ලබාදීමට අපේක්ෂා කර තිබුණු අතර ජල සම්බන්ධතා 193ක් ලබා දී තිබුණි. එයින් ද 123ක් පැවති ජල

සම්පාදන ක්‍රමය යටතේ ජල සම්බන්ධතා ලබා ගත් පවුල් වන අතර මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදුන් නව සම්බන්ධතා ගණන 70ක් පමණක් විය. ඒ අනුව ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

ii. ප්‍රාදේශීය සභාවේ ආදායම ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කර තිබුණ ද ජල ගාස්තු ආදායමේ ප්‍රමාණවත් ඉහළ යාමක් නිරීක්ෂණය නොවීය.

iii. කාලීනව ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කරමින් ගුණාත්මකභාවයෙන් යුතු ජලය සැපයිය යුතු වුව ද මෙම ව්‍යාපෘතියේ ජලය විද්‍යාගාර පරීක්ෂණයකට යොමු කර නොතිබුණි.

**(ඇ). රත්තොට ජල යෝජනා ක්‍රමය**

රු.මිලියන 27.78ක වියදමෙන් රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද පොල්වත්තාකන්ද ජල යෝජනා ක්‍රමය 2017 ජූනි 30 දින භාර දී තිබුණ ද ප්‍රාදේශීය සභාවෙන් ලද තොරතුරු අනුව මහජනතාවගේ ප්‍රයෝජනයට ජලය ලබා දීම සහ ජල ගාස්තුවක් අය කිරීම 2018 ජූලි මාසය දක්වා ප්‍රමාද කර තිබුණි.

i. දිනකට ජලය 160$m^3$ බැගින් වර්ෂයක් සඳහා 58,400 $m^3$ක් බෙදාහැරීමට අපේක්ෂා කළ ද, 2018 ජූලි සිට 2019 ජූනි දක්වා සපයා ඇති ජල ප්‍රමාණය 22,185$m^3$ක් වීමෙන් ජලය 36,215$m^3$ක් අඩුවෙන් සැපයීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ජල ප්‍රමාණය නිකුත් කිරීමට නොහැකි වී ඇති අතර අපේක්ෂිත සැපයුම් ධාරිතාවයෙන් සියයට 38ක් පමණ සපුරා ඇති බව නිරීක්ෂණය විය.

ii. ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් තොරතුරුවලට අනුව ජලය 58,400 $m^3$ක් නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් ජල මූලාශ්‍රයක් නොපවතින බව නිරීක්ෂණය වීමෙන් ප්‍රමාණවත් අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය සැලසුම් කර ඇති බව නිරීක්ෂණය විය.

iii. මෙම ප්‍රදේශයේ වෙනත් ප්‍රජා ජල ව්‍යාපෘතියක් පැවති අතර එම ජල යෝජනා ක්‍රමය මගින් පදිංචිකරුවන්ගේ ජල ඉල්ලුම සපයා දීමට නොහැකි වීම මෙම නව ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හේතු වී ඇතත් එමගින් ද පදිංචිකරුවන්ගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

iv. ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් තොරතුරුවලට අනුව පෙරහන් ටැංකි මගින් නිසි පරිදි පෙරීම සිදු නොවීමෙන් අපේක්ෂිත ප්‍රමාණයට මෙන් ම අපේක්ෂිත ගුණාත්මකභාවයෙන් යුතු ජලය ලබා දීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

**(ඈ). ලග්ගල පල්ලේගම ජල ව්‍යාපෘතිය**

රු.මිලියන 58.57ක් වැය කර නිම කළ මෙම ව්‍යාපෘතිය 2017 මැයි 25 දින ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණි.

ව්‍යාපෘතිය යටතේ පවුල් 328කට පිරිපහදු කරන ලද පානීය ජලය ලබාදීමට සැලසුම් කර තිබූ අතර ආරම්භයේදී ම ජල සම්බන්ධතාවයන් ලබාදීමට අපේක්ෂා කළ පවුල් ගණන 250ක් විය. නමුත් මේ වන විටත් ලබා දී ඇති ජල සම්බන්ධතා ගණන 146ක් වීමෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ඉලක්ක පූර්ණ වශයෙන් ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඉ). රාජාංගනය ජල ව්‍යාපෘතිය**

දැයට කිරුළ වැඩසටහන යටතේ කැණීම් කරන ලද ළිඳක් භාවිත කරමින්, රු.මිලියන 18.86ක් වැය කර මෙම ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර නියමිත වැඩ කටයුතු අවසන් වීමෙන් පසු 2016 ජූලි 04 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

i. රාජාංගනය වැවෙන් ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබා ගන්නා ජනතාව එම ජලය ම දෛනික කටයුතු සඳහා භාවිත කළ ද වියළි කාලයේ ජලය සපයා ගැනීමේදී මුහුණ දෙන දුෂ්කරතාවයන් නිසා රාජාංගනය නගරය ඇතුළු ගම් ප්‍රදේශවල පදිංචි පවුල් 200කට ජලය සපයා දීමේ අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ නමුත් ව්‍යාපෘතිය යටතේ සපයනු ලබන ජලය පානය කිරීම සඳහා සුදුසු තත්ත්වයේ නොපවතින බැවින් පානීය ජලය සැපයීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

ii. ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවට භාර දීමෙන් පසු මුල් වසර 5 තුළ ජල ගාස්තු ලෙස වර්ෂයකට රු.මිලියන 1.37ක පමණ ආදායමක් අපේක්ෂා කර තිබුණ ද විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ජල ව්‍යාපෘතිය විවෘත කළ දින සිට මේ දක්වා ලබා ඇති සම්පූර්ණ ආදායම රු.මිලියන 0.52ක් විය.

**(ඊ). පොල්පිතිගම බහුකාර්ය ගොඩනැගිල්ල**

රු.මිලියන 24.04ක් වැය කර ඉදිකරන ලද සෞඛ්‍ය මධ්‍යස්ථානය, දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ ශ්‍රවණාගාරයකින් සමන්විත බහුකාර්ය ගොඩනැගිල්ල 2017 ඔක්තෝබර් 27 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.




ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය ප්‍රාදේශීය සභාවේ සභාගර්භය ලෙසත්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයට වෙන් කළ ඉඩ ගබඩාවක් ලෙසත් භාවිත කෙරෙන අතර සෞඛ්‍ය සායනය සඳහා වෙන් කළ කොටස බදුදීමට කටයුතු කර තිබුණි. මේ අනුව සම්පූර්ණ ගොඩනැගිල්ල ම අපේක්ෂිත අරමුණුවලින් බැහැරව උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(උ). ගලෙන්බිඳුණුවැව බහුකාර්ය ගොඩනැගිල්ල**

පුස්තකාලය, ශ්‍රවණාගාරය සහ පෙර පාසල සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 34.80ක් වැය කරමින් ඉදිකරන ලද මෙම බහුකාර්ය ගොඩනැගිල්ල 2017 දෙසැම්බර් 21 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ අතර එදින ම මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

i. මෙම බහුකාර්ය ගොඩනැගිල්ලේ ශ්‍රවණාගාරය කුලියට දීමෙන් ප්‍රාදේශීය සභාවට මාසයකට රු.210,000ක ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද පසුගිය මාසවල සත්‍ය ආදායමේ සාමාන්‍යය රු.1,091ක් විය.

ii. බහුකාර්ය ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී පෙර පාසලක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හා සායනයක් පවත්වාගෙන යාමට අපේක්ෂා කළ නමුත් එම කාර්යයන් සඳහා යොදා නොගැනීමෙන් පිළිවෙලින් වාර්ෂිකව ලබාගැනීමට අපේක්ෂා කළ රු.54,000, රු.48,000 හා රු.240,000ක ආදායම් හා ප්‍රදේශයේ ජනතාවට ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ලබා දීමට අපොහොසත් වී තිබුණි.

**(ඍ). පදවිය බහුකාර්ය ගොඩනැගිල්ල**

ශ්‍රවණාගාරය, සභා කාර්යාලය සහ පුස්තකාලය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 17.08ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල 2015 මැයි 15 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ අතර එදින ම මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

i. ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී සභා කාර්යාලය හා පුස්තකාලය ද ඇතුළත් කර තිබුණු නමුත් ඉදිකිරීමේදී ශ්‍රවණාගාරයක් පමණක් ඉදිකිරීමෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ ආදායම් ඉලක්ක හා සමාජ ප්‍රතිලාභ නොලැබෙන බව නිරීක්ෂණය විය.

ii. ශ්‍රවණාගාරය කුලියට දීමෙන් මාසයකට රු.160,000ක ආදායමක් අපේක්ෂා කර තිබූ අතර විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ශ්‍රවණාගාරයෙන් ලබා ගත් සාමාන්‍ය මාසික කුලී ආදායම රු.10,322ක් විය.

**(එ). හොරොව්පතාන බහුකාර්ය ගොඩනැගිල්ල**

රැස්වීම් ශාලාව, පෙර පාසල, දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා වෛද්‍ය සායනය පැවැත්වීම සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 39.94ක වියදමෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකර 2015 අගෝස්තු 12 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

i. අපේක්ෂා කර තිබූ පරිදි වෛද්‍ය සායනය නොපැවැත්වීම හේතුවෙන් වර්ග අඩි 661.56ක්, එනම් ගොඩනැගිල්ලෙන් සියයට 23.91ක ප්‍රමාණයක් නිශ්කාර්යව පවතින අතර එයින් ලබා ගැනීමට අපේක්ෂා කළ රු.600,000ක වාර්ෂික ආදායම අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

ii. රැස්වීම් ශාලාව කුලියට දීමෙන් මාසයකට රු.360,000ක ආදායමක් අපේක්ෂා කර තිබූ අතර විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ලැබී ඇති සාමාන්‍ය මාසික කුලී ආදායම රු.3,250ක් විය.

iii. මෙම ගොඩනැගිල්ල හොරොව්පතාන ප්‍රාදේශීය රෝහල ආසන්නයේ පිහිටා ඇති බැවින් වෛද්‍ය සායනයක් සඳහා ඉදිකිරීමක් සිදුකිරීමේ අවශ්‍යතාව හඳුනා නොගෙන සැලසුම් කිරීමක් බව නිරීක්ෂණය විය.

**(ඒ). ඉපලෝගම බහුකාර්ය ගොඩනැගිල්ල**

ශ්‍රවණාගාරයක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්, පෙර පාසලක් සහ වෛද්‍ය සායන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා සැලසුම් කර, රු.මිලියන 40.79ක වියදමෙන්

2016 මාර්තු 01 දින ඉදිකිරීම් නිම කර 2016 ජුනි 29 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

මෙහි ශ්‍රවණාගාරයෙන් රු.310,000ක මාසික කුලී ආදායමක් අපේක්ෂා කර තිබූ අතර විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ලැබී ඇති සාමාන්‍ය මාසික කුලී ආදායම රු.5,335ක් විය.

**(ඕ). වැලිවිටිය දිවිතුර බහුකාර්ය ගොඩනැගිල්ල**

පුස්තකාලය, වෛද්‍ය සායනය, පෙර පාසල හා ශ්‍රවණාගාරය සඳහා සැලසුම් කර, රු. මිලියන 33.45ක වියදමකින් ඉදිකිරීම් නිම කරන ලද මෙම ගොඩනැගිල්ල 2016 අප්‍රේල් 07 දින ප්‍රාදේශීය සභාවට භාර දීමෙන් පසු 2016 අගෝස්තු 28 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

පෙර පාසල පවත්වාගෙන නොයන අතර ඒ සඳහා වෙන් කළ ඉඩ ප්‍රමාණය ශ්‍රවණාගාරයේ කටයුතු සඳහා ම යොදා ගනු ලබන බව ප්‍රාදේශීය සභාවේ තොරතුරු අනුව පැහැදිළි විය. ශ්‍රවණාගාරය සඳහා දෛනික කුලිය රු.3,000ක් ලෙස ඇස්තමේන්තු කර, ඒ අනුව රු. 30,000ක මාසික කුලී ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කළ ද විවෘත කළ දිනයේ සිට මේ දක්වා ලැබී ඇති ආදායම අනුව සාමාන්‍ය මාසික කුලී ආදායම රු.2,819ක් විය.

**(ඖ). කරන්දෙණිය,තවලම, පිටබැද්දර, කොටපොළ, ඉමදූව ප්‍රාදේශීය සභා සඳහා ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිලි**

| ප්‍රාදේශීය සභාව | වියදම (රු.මිලියන) | ඉදිකිරීම් නිම කර භාර දුන් දිනය | විවෘත කළ දිනය |
|---|---|---|---|
| කරන්දෙණිය | 25.45 | 2015.05.12 | 2015.05.12 |
| තවලම | 59.10 | 2017.02.28 | 2017.09.14 |
| පිටබැද්දර | 46.01 | 2016.08.11 | 2017.07.10 |
| කොටපොළ | 44.92 | 2016.07.06 | 2017.07.10 |
| ඉමදූව | 36.54 | 2017.03.06 | 2017.06.28 |

ඉහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නිර්මාණ හා සැලසුම් කාර්ය සඳහා පෞද්ගලික ඉදිකිරීම් උපදේශන සමාගම්වල සේවය ලබාගෙන තිබුණ ද එම ආයතන විසින් ලබා දිය යුතු ශක්‍යතා අධ්‍යයන වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

උක්ත ප්‍රාදේශීය සභා වෙතින් ලබාදුන් තොරතුරු අනුව ශ්‍රවණාගාරවලින් ප්‍රමාණවත් භාවිතයක් හා ප්‍රමාණවත් ආදායමක් නොලබන බවත්, අපේක්ෂිත කාර්යයන් වූ පුස්තකාල, දිවා සුරකුම් මධ්‍යස්ථාන හා සෞඛ්‍ය සායන ආදිය සඳහා ගොඩනැගිලි යොදවා නොතිබුණි.

**(ක).බුලත්කොහුපිටිය බහුකාර්ය ගොඩනැගිල්ල**

පුස්තකාලය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, ආයුර්වේද මධ්‍යස්ථානය, රැස්වීම් ශාලාව හා පොදු වැසිකිලි පද්ධතිය සඳහා යොදා ගැනීමට සැලසුම් කර රු. මිලියන 26.33 ක වියදමෙන් 2016 මාර්තු 31 දින ඉදිකිරීම් අවසන් කර, ප්‍රාදේශීය සභාව සඳහා භාර දෙන ලද මෙම ගොඩනැගිල්ල 2017 පෙබරවාරි 23 දින මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි.

මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 335.06ක් වන මෙම ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහල්වල වර්ග මීටර් 249.78ක ශ්‍රවණාගාරයක් ඉදිකර තිබූ අතර ඉන් දිනකට රු.3,000 බැගින් මාසයකට රු.30,000ක කුලී ආදායමක් අපේක්ෂා කළ ද එය ඌන උපයෝජිත තත්ත්වයේ පවතී. ප්‍රාදේශීය සභාවේ පොත්පත් අනුව මෙම ගොඩනැගිල්ල මහජනතාවට විවෘත කළ 2017 පෙබරවාරි 23 දින සිට 2019 ඔක්තෝබර් 30 දක්වා ලබා ඇති මුළු ආදායම රු. 18,000ක් වීමෙන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් කිසිදු දායකත්වයක් සපයා නොමැති බවත් ගොඩනැගිල්ලේ නඩත්තු වියදම හා සැසඳීමේදී එය ප්‍රාදේශීය සභාවට වැය බරක් බවත් නිරීක්ෂණය විය.

**(ඛ) අයගම බහුකාර්ය ගොඩනැගිල්ල**

මෙම ගොඩනැගිල්ල සමඟ බස්නැවතුම්පළ හා පොදු වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා රු.මිලියන 30.58ක් වැය කර තිබුණු අතර 2016 අප්‍රේල් 26 දින ඉදිකිරීම් නිම කර ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි.

මෙම ගොඩනැගිල්ල බස්නැවතුම, ආපන ශාලාව, තරුණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, පොත් සාප්පුව, පුස්තකාලය, ෆාමසිය, තොරතුරු මධ්‍යස්ථානය සහ සනීපාරක්ෂක මධ්‍යස්ථානය සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබුණ ද 2017 මැයි 25 දින සිදු වූ නායයාමෙන් අහිමි වූ පොලිස් ස්ථානය වෙනුවට මෙම ගොඩනැගිල්ලේ කාමර 05ක අයගම පොලිස් ස්ථානය පවත්වාගෙන යන බැවින් සනීපාරක්ෂක මධ්‍යස්ථානය ද පොලිස් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා නතුව තිබේ. මෙම තත්ත්වය යටතේ බස් නැවතුම්පොළ පවත්වාගෙන ගිය ද ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

**(ග). හෙට්ටිපොළ ආදාහනාගාරය**

ඉතා දුෂ්කර අඩු ආදායම්ලාභී පුද්ගලයන් වාසය කරන ජනශූන්‍ය ප්‍රදේශයක් වන හෙට්ටිපොළ ප්‍රදේශයේ රු.මිලියන 16.49ක වියදමෙන් ආදාහනාගාරය ඉදිකර ඇති අතර දිනකදී එහි මෘතදේහ 2ක් ආදාහනය කළ හැකිය. මේ සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රු.7,000ක් සහ බල ප්‍රදේශයෙන් පිටත රු.8,000ක් වශයෙන් ගාස්තු අය කිරීමට තීරණය විය. ඉදිකිරීම් නිමකර ප්‍රාදේශීය සභාවට භාර දීමෙන් පසු 2016 මාර්තු 09 දින භාවිතා කිරීම ආරම්භ කළ ද ආදාහනාගාරය පිහිටි පොදු සුසාන භූමියේ අඩු පිරිවැයකින් භූමදාන කටයුතු සිදුකළ හැකි වීමෙන් ආදාහනාගාරය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති විය. එබැවින් ප්‍රාදේශීය සභාවේ ආදායම වැඩිවීම වෙනුවට ප්‍රාදේශීය සභාවට අමතර වැය බරක් ඇති වී තිබෙන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ආදායම | සේවක වැටුප් හා දීමනා හැර නඩත්තු පිරිවැය |
|---|---|---|
| | (රු.) | (රු.) |
| 2017 | 41,000 | 70,130 |
| 2018 | 44,000 | 27,750 |
| 2019 | 54,000 | 220,000 |

### 3.3.2.4 අපේක්ෂිත අරමුණෙන් බැහැරව කාර්යාල පවත්වා ගැනීමට යොදවා ඇති බහුකාර්ය ගොඩනැගිලි

මාතෘ සායන, වෛද්‍ය සායන, පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, පුස්තකාල, ශ්‍රවණාගාර ආදී අංගවලින් සමන්විතව ඉදිකරන ලද බහුකාර්යය ගොඩනැගිලි අපේක්ෂිත කාර්යයන්වලට භාවිත නොකර ප්‍රාදේශීය සභා කාර්යාල ලෙස භාවිත කරනු ලබන බව නියැදි විගණන පරීක්ෂාවේදී තහවුරු විය. විස්තර පහත දැක්වේ.

**(අ). උඩුබද්දාව බහුකාර්ය ගොඩනැගිල්ල**

රු.මිලියන 43.63ක් වැය කර ඉදි කර තිබූ මෙම ගොඩනැගිල්ලේ ඉහළ මහල ප්‍රජා ශාලාව සඳහා ද, බිම් මහල ආයුර්වේද සහ බටහිර වෛද්‍ය සායන, මාතෘ සායනය හා ළමා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ද යොදා ගැනීමට සැලසුම් කර තිබුණි.




i. ව්‍යාපෘති කාර්යාලය විසින් මෙම ගොඩනැගිල්ල 2016 ජනවාරි 08 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබුණි. ප්‍රාදේශීය සභාව පැවති සභා ගොඩනැගිල්ල අබලන් වීම හේතුවෙන් 2017 ජූනි 12 දින සිට මෙම ගොඩනැගිල්ල සභා කාර්යාලය ලෙස භාවිත කරන බව නිරීක්ෂණය විය.

ii. ආයුර්වේද සහ බටහිර වෛද්‍ය සායනය, ළමා සුරකුම් මධ්‍යස්ථානය හා මාතෘ සායනය යනාදී කිසිවක් ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර නොතිබුණි.

iii. ආයුර්වේද හා බටහිර වෛද්‍ය සායනය, මාතෘ සායනය හා දිවා සුරකුම් මධ්‍යස්ථානය සඳහා කොටස් වෙන් කර (Partition) තිබූ බිම්මහල කාර්යාලය සඳහා භාවිත කිරීම නිසා කාර්යාලයකට සුදුසු අභ්‍යන්තරික සැලැස්මක් නොතිබූ බැවින් කාර්යාල කළමනාකරණය, සේවක කළමනාකරණය දුර්වල මට්ටමක පැවතීමෙන් මහජනතාවට කාර්යාලයෙන් අපේක්ෂිත සේවා ද නොලැබෙන බව නිරීක්ෂණය විය.

iv. ප්‍රජා ශාලාව කුලියට දීම මගින් ආර්ථික ප්‍රතිලාභ ලෙස දිනකට රු. 20,600 බැගින් වර්ෂයකට රු.3,460,000ක ආදායමක් ලබා ගත හැකි ලෙස ඇස්තමේන්තු කිරීමෙන් ප්‍රතිලාභ අධිතක්සේරු කර ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කර තිබුණු බවත්, දිනකට රු.2,500ක ගාස්තුවක් අය කිරීමට තීරණය කළ ද ප්‍රජා ශාලාවෙන් මේ වන තෙක් ආදායමක් ලැබී නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ). පාතහේවාහැට බහුකාර්ය ගොඩනැගිල්ල**

සභා කාර්යාලය, පුස්තකාලය සහ ප්‍රජා මධ්‍යස්ථානය සඳහා යොදා ගැනීමට සැලසුම් කර, රු.මිලියන 46.72ක වියදමෙන් ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ල 2017 ජූනි 07 දින ප්‍රාදේශීය සභාවට භාර දීමෙන් පසු 2017 ඔක්තෝබර් 28 දින මහජනතාව සඳහා විවෘත කර තිබුණ ද එය සභා කාර්යාලය පවත්වාගෙන යාම සඳහා පමණක් භාවිත කර තිබුණි.

### 3.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ උප ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ද්විත්ව කවර ක්‍රමය භාවිත කර තිබුණි. සැලසුම්, නිර්මාණ හා ඉදිකිරීම් අධ්‍යයනය සඳහා උපදේශක සමාගම් තෝරා ගැනීමට ආසියානු සංවර්ධන බැංකු ප්‍රසම්පාදන උපදෙස් සංග්‍රහයේ සඳහන් ගුණත්ව පාදක ඇගයීම් ක්‍රමය (QCBS) මත උපදේශක සමාගම් තෝරාගෙන තිබුණි.

ප්‍රාදේශීය සභාවක් සඳහා රු.මිලියන 50ක මූලික වෙන් කිරීමක් සහිතව ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ද්විත්ව කවර ක්‍රමය භාවිත කිරීමෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් වැඩි දෙනෙකුට කොන්ත්‍රාත් ලබා ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව කොන්ත්‍රාත් සඳහා ලද මිල ගණන් සංඛ්‍යාව දෙස බැලීමේදී පෙනී යයි. කොන්ත්‍රාත්කරුවන්ගේ සුදුසුකම්වලට අදාළ පළමු කවරයට ඇතුළත් කළ යුතු තොරතුරු සැපයීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි, සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන්ට නොහැකි වීම මෙම තත්ත්වයට හේතු වී ඇති බැවින් කොන්ත්‍රාත් සඳහා තරඟකාරී මිල ගණන් ලැබී ඇති බව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. ගුණත්ව පාදක ඇගයීම් ක්‍රමය මත උපදේශක සමාගම් තෝරා ගැනීම නිසා තරඟකාරී මිල ගණන් යටතේ එම කොන්ත්‍රාත් පිරිනැමිය නොහැකි වී ඇත. ඒ අනුව පුරනැගුම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් හා උපදේශක සමාගම් තෝරා ගැනීමේදී ආර්ථිකභාවය පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

## 4. නිර්දේශ

i. පළාත් පාලන ආයතන මට්ටමෙන් හා පළාත් සභා මට්ටමෙන් සංවර්ධන සැලසුම් තිබිය යුතු අතර ඒවායෙහි අවශ්‍යතාව ප්‍රමුඛතාගත කොට තිබිය යුතුය. අදාළ පළාත් පාලන ආයතනයට හෝ පළාත් සභාවලට ක්‍රියාත්මක කර ගත නොහැකි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මධ්‍යම රජයේ සංවර්ධන ව්‍යාපෘතිවලින් මූල්‍ය පහසුකම් ලබා දීම වඩාත් ඵලදායී වේ.

ii. නිවැරදි දත්ත ලබාගෙන ශක්‍යතා අධ්‍යයන සිදු කර ඉහළ සාර්ථකත්වයක් හා ආයෝජිත මුදලට සාපේක්ෂව වැඩි ම ප්‍රතිලාභයක් ලැබිය හැකි උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් ණය භාවිත කළ යුතුය.

iii. මධ්‍යම රජය ණය ලබාගෙන සිදු කරන සංවර්ධන කාර්යයන්වලදී ප්‍රාදේශීය සභාවන් විසින් අනිවාර්යයෙන් ම කළ යුතු කාර්යයන් සඳහා පමණක් එම ණය ආයෝජනය කළ යුතු අතර ඉටු කිරීමට බලය ඇතත් අනිවාර්ය නොවූ කාර්යයන් සඳහා ආයෝජනය

කිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල හා වාණිජ බැංකු ආදියෙන් ණය ලබා ගැනීමටත්, එම ණය වාරික ආපසු ගෙවීමටත් ප්‍රාදේශීය සභාවන් උනන්දු කළ යුතුය.

iv. තෝරා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ සැලසුම් නිර්මාණ පමණක් නොව විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවන් ද, පුද්ගලික උපදේශක සමාගම් මගින් සිදු කරගෙන ඇති බැවින් උප ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීමේ හැකියාව පිළිබඳ වගකීමක් ඇති ඔවුන් ද වගකීම් කාලයකට යටත් කළ යුතුය.

v. අතහැර දමා ඇති ගොඩනැගිලි වෙනත් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලිය යුතුය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

2022 ජූනි 02 දින

ඇමුණුම 01

## B. Overall Project Implementation Plan

| DESCRIPTION | 2011 | | | 2012 | | | | 2013 | | | | 2014 | | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 |
| **Component 1: Local Government Infrastructure and Service Delivery Improvement** | | | | | | | | | | | | | | | | | | | |
| 1.1 Planning and priority subproject identification (assisted by PPTA) | | | | | | | | | | | | | | | | | | | |
| 1.2 Review of subprojects by PMU and SPCUs | | | | | | | | | | | | | | | | | | | |
| 1.3 Recruitment of design and supervision consultants | | | | | | | | | | | | | | | | | | | |
| 1.4 Preparation of feasibility studies, detailed design and bid documents of subprojects | | | | | | | | | | | | | | | | | | | |
| 1.5 Bidding and contract award for civil works and equipment | | | | | | | | | | | | | | | | | | | |
| 1.6 Construction and procurement of equipment | | | | | | | | | | | | | | | | | | | |
| 1.7 Operation and maintenance support | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| **Component 2: Local Government Policy Reform and Capacity Building Support** | | | | | | | | | | | | | | | | | | | |
| 2.1 Recruitment of consultants for data updates and entry for local authorities | | | | | | | | | | | | | | | | | | | |
| 2.2 Data updates and entry | | | | | | | | | | | | | | | | | | | |
| 2.3 Bidding for IT system development (hardware and software) | | | | | | | | | | | | | | | | | | | |
| 2.4 IT system development | | | | | | | | | | | | | | | | | | | |
| 2.5 Implementation of the new system and business processes | | | | | | | | | | | | | | | | | | | |
| 2.6 Evaluation of implementation of the new system and business processes | | | | | | | | | | | | | | | | | | | |
| CDTA *capacity Development technical Assistance* | | | | | | | | | | | | | | | | | | | |
| Recruitment of CDTA consultants | | | | | | | | | | | | | | | | | | | |
| Review of existing tax, licensing and approval systems and processes | | | | | | | | | | | | | | | | | | | |
| Review of software developed by ICTA *Institute of Computer* | | | | | | | | | | | | | | | | | | | |
| Preparation for the two packages under Component 2 | | | | | | | | | | | | | | | | | | | |
| Review and approval of the proposed changes by the government | | | | | | | | | | | | | | | | | | | |
| Drafting by-laws and regulations for streamlining and improvement | | | | | | | | | | | | | | | | | | | |
| Review and approval of the proposed by-laws and regulations by the government | | | | | | | | | | | | | | | | | | | |
| Support for implementation of the new system and business processes | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| **Component 3: Project Management and Administration Support** | | | | | | | | | | | | | | | | | | | |
| 3.1 Assignment of core staff in PMU and SPCUs | | ◊ | | | | | | | | | | | | | | | | | |
| 3.2 PMU and SPCUs fully staffed | | | | ◊ | | | | | | | | | | | | | | | |
| 3.3 Recruitment of project management consultant (assisted by PPTA) | | | | | | | | | | | | | | | | | | | |
| 3.4 Reform plan development (assisted by PPTA) | | | | | | | | | | | | | | | | | | | |
| 3.5 Review of reform plans by PMU and SPCUs | | | | | | | | | | | | | | | | | | | |
| 3.6 Development of project performance management system | | | | | | ◊ | | | | | | | | | | | | | |
| 3.7 Project management and administration | | | | | | | | | | | | | | | | | | | |
| 3.8 Project-specific evaluation survey | | | | | | | | | | | | | | | | | | | |
| 3.9 Reform plan implementation and monitoring | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| Implemenation of Gender Action Plan | | | | | | | | | | | | | | | | | | | |

——— time frame for first group of subprojects ═══ time frame for other subprojects

ICTA = Information & Communication Technology Agency, MLGPC = Ministry of Local Government and Provincial Councils, PMU = project management unit, PPTA = project preparatory technical assistance, SPCU = subproject coordination unit

ඇමුණුම 02

**2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිම නොවූ උප ව්‍යාපෘති**

| අ.අ | පළාත් පාලන ආයතනය | උප ව්‍යාපෘතිය | වටිනාකම (රු.මිලියන) | අවසන් කළ දිනය | ප්‍රමාදය (දින) |
|---|---|---|---|---|---|
| 1 | වැල්ලවාය ප්‍රා.ස | ආදාහනාගාරය | 11.72 | 2017 ජනවාරි 05 | 5 |
| 2 | සියඹලාණ්ඩුව ප්‍රා.ස | බස්නැවතුම සහ වැසිකිළි පද්ධතිය | 6.37 | 2017 ජනවාරි 08 | 8 |
| 3 | කන්දකැටිය ප්‍රා.ස | ප්‍රාදේශීය සභා කාර්යාලය හා සතිපොළ ඉදිකිරීම | 25.45 | 2017 ජනවාරි 10 | 10 |
| 4 | හසලක, මිණිපේ ප්‍රා.ස | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 62.35 | 2017 ජනවාරි 31 | 31 |
| 5 | ලුණුගල ප්‍රා.ස | ප්‍රාදේශීය සභා කාර්යාලය හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 36.97 | 2017 පෙබරවාරි 10 | 41 |
| 6 | වෙලිඔය, බලන්ගොඩ, රත්නපුර ප්‍රා.ස | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 30.01 | 2017 පෙබරවාරි 13 | 44 |
| 7 | පැල්මඩුල්ල, රත්නපුර ප්‍රා.ස | බහුකාර්ය ගොඩනැගිල්ල සහිත සතිපොළ ඉදිකිරීම. | 44.92 | 2017 පෙබරවාරි 13 | 44 |
| 8 | තණමල්විල ප්‍රා.ස | ප්‍රාදේශීය සභා කාර්යාලය හා සතිපොළ ඉදිකිරීම. | 36.17 | 2017 පෙබරවාරි 25 | 56 |
| 9 | යටියන්තොට, කෑගල්ල ප්‍රා.ස | සතිපොළ සහ පොදු වැසිකිළි පද්ධතිය ඉදිකිරීම. | 36.60 | 2017 පෙබරවාරි 25 | 56 |
| 10 | ගලහ, පාතහේවාහැට ප්‍රා.ස | කාර්යාලය සහිත බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 46.72 | 2017 මාර්තු 30 | 61 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | උඩුදුම්බර ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතිය | 41.63 | 2017 මාර්තු 30 | 61 |
| 12 | හඳුන්ගමුව, විල්ගමුව ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතිය | 61.00 | 2017 මාර්තු 31 | 62 |
| 13 | මහියංගනය ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතියේ පිරිපහදු මධ්‍යස්ථානය | 46.25 | 2017 මැයි 30 | 150 |
| 14 | මහියංගනය ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතියේ ජලනළ පද්ධතිය | 45.74 | 2017 මැයි 30 | 150 |
| 15 | උඩපළාත ප්‍රා.ස | ජලය ලබා ගන්නා ස්ථානය හා ජලය බෙදාහැරීමේ පද්ධතිය ඉදිකිරීම. | 183.53 | 2017 ජූනි 30 | 180 |
| 16 | මහව/පොල්පිතිගම ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදිකිරීම. | 34.83 | 2017 ජූනි 30 | 180 |
| 17 | වනාතවිල්ලුව, පුත්තලම ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදිකිරීම. | 57.94 | 2017 ජූනි 30 | 180 |
| 18 | මැදගම ප්‍රා.ස | සතිපොළ හා පැති බැම්ම වැඩිදියුණු කිරීම. | 15.52 | 2017 ජූනි 30 | 180 |
| 19 | බුල්නෑව, ගල්නෑව ප්‍රා.ස | ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදිකිරීම. | 20.02 | 2018 ජනවාරි 12 | 377 |

## E. Detailed Cost Estimates by Year

($ million)

| Item | Total Cost | Year 1 | Year 2 | Year 3 | Year 4 |
|---|---|---|---|---|---|
| A. Investment Costs | | | | | |
| 1 Civil Works and Equipment | 40.14 | - | 5.02 | 12.04 | 23.08 |
| 2 Environment and Social Mitigation | 0.40 | 0.10 | 0.10 | 0.10 | 0.10 |
| 3 System Development | 1.39 | 0.13 | 0.24 | 0.49 | 0.53 |
| 4 Consultants | 6.58 | 1.02 | 1.76 | 1.90 | 1.90 |
| a. Design and Supervision | 4.29 | 0.66 | 1.15 | 1.24 | 1.24 |
| b. Project Management and Capacity Development | 2.29 | 0.35 | 0.62 | 0.66 | 0.66 |
| 5 Taxes | 7.54 | 0.30 | 1.13 | 2.22 | 3.88 |
| Subtotal (A) | 56.05 | 1.54 | 8.26 | 16.76 | 29.49 |
| B. Incremental Recurrent Costs | | | | | |
| 1 Project Management and Administration | 4.18 | 1.05 | 1.05 | 1.05 | 1.05 |
| 2 Taxes | 0.08 | 0.02 | 0.02 | 0.02 | 0.02 |
| Subtotal (B) | 4.26 | 1.07 | 1.07 | 1.07 | 1.07 |
| Total Base Cost | 60.31 | 2.61 | 9.32 | 17.82 | 30.56 |
| C. Contingencies | 7.45 | 0.08 | 0.88 | 2.15 | 4.34 |
| D. Financing Charges During Implementation | 1.01 | 0.02 | 0.11 | 0.29 | 0.59 |
| Total Project Cost (A+B+C+D) | 68.77 | 2.70 | 10.32 | 20.26 | 35.49 |
| % Total Project Cost | 100.00% | 3.93% | 15.00% | 29.46% | 51.60% |

Note: Numbers may not sum precisely because of rounding